The Journal of the Faculty of Humanities (JHU) (2025), Volume 33, Issue 1, 17-50
ISSN 1391-5096 (Print), ISSN 2783 – 8951 (Online)

# පාලි-සිංහල සාහිත්‍යගත මේඝය සහ කාලිදාසකෘත මේඝදූත ඛණ්ඩකාව්‍යාවධානී ව සංස්කෘත සාහිත්‍ය කවුළුවෙන් මේඝ සංකල්පාවලෝකනය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ

## Abstract

The term 'Mēghā' (cloud) is used exclusively in the three languages of Sanskrit, Pāli, and Sinhala to refer to the concept of rainclouds. For instance, words such as 'Varivāha,' 'Jaladharā,' 'Ambubhṛt,' 'Thōyada,' and 'Payodharā' can be considered. According to lexical sources relevant to these languages, the definition of 'Mēghā' is provided along with a set of technical terms. The creative works impregnated with the concept of 'Mēghā' are prominent in these three languages. In the field of musicology, 'Mēghā' also appears as a rāga. The religious expression of the 'Mēghā' concept is encountered in Pāli literature. Within the Tripitaka literature, 'Mēghā' has been frequently used as a religious conceptual term. In both Sinhala and Sanskrit literature, the concept of 'Mēghā' has been largely associated with aesthetic expressions. The usage of 'Mēghā' and its technical terms in these languages appears to be highly metaphorical. Whilst Sinhala poet directs attention towards

the birds, in the context of Sinhala Sandēśa poetry, Sanskrit poet's greater focus was directed towards the concept of the cloud. The Sinhala poetic concept of ‘Mēghā’ can be seen in classical Sinhala literature, Colombo literature, modern poetry, and lyrics, often symbolizing clouds which are not necessarily related to rain. In this case, the Vēdik understanding of the ‘Mēghā’ concept is largely influenced by the Ṛgveda. In Sanskrit literature, the most notable expression of the ‘Mēghā’ concept is found in Kālidāsa's *Meghāduta* (Cloud Messenger). The humanized representation of the cloud in this work is often discussed in detail. *Meghāduta* can also be identified as a precursor to the genre of *duta*-kāvya (messenger poetry). The concept of ‘Mēghā’ transcends specific geographical, temporal, and linguistic boundaries, making it a timeless concept. Scholars continue to explore further research avenues regarding this concept.

**Keywords:** *Dūtakāvya, Megha, Kālidāsa, Meghadūta, Ṛgveda*

## හැඳින්වීම

ඍග්වේද - යජුර්වේද - සාමවේද - අථර්වවේද යන චතුස්සංහිතා යනු අතීත භාරතීයයන්ගේ ඥාන සංචිතය යි. ඍග්වේද සංහිතාවේ දෘශ්‍යමාන පර්ජන්‍ය යනු දේවත්වාරෝපිත මේඝය යි. පාලි භාෂා සාහිත්‍යය ද ආගමික දෘෂ්ටි කෝණයෙන් මේඝය භාවිතයට ගනියි. සිංහල භාෂා සාහිත්‍යයික ප්‍රවණතාව වන්නේ සෞන්දර්යාත්මක දෘෂ්ටියෙන් මේඝය අවලෝකනය කිරීම යි. මේ අතර මේඝ සංකල්පය පිළිබඳ සංස්කෘත සාහිත්‍යාගත උපරි ප්‍රකාශනය වශයෙන් අපට හඳුනා ගැන්මට ලැබෙන්නේ කාලිදාසයන්ගේ මේඝදූතය යි.

මේඝ යනු සංස්කෘත, පාළි සහ සිංහල යන භාෂා ත්‍රයේ ම වැසිවලාකුළ උදෙසා භාවිත වචනයකි. **‘මේහති සිඤ්චති යඃ’**[1] යන ශබ්දකල්පාද්‍රුමාගත විග්‍රහ වාක්‍යයට අනුව දිය වැක්කිරීම, දියෙන් තෙමීම සිදුකරන්නේ යමක් ද යමෙක් ද ඒ මේඝය යි. තත් කෝශ

1. ශබ්දකල්පද්‍රුමඃ තෘතීය කාණ්ඩය; රාජා රාධා කාන්තදේව, කල්කටා, 1886, 776 පිටුව.

ග්‍රන්ථය ශබ්දරත්නාවලී, රත්නමාලා, ත්‍රිකාණ්ඩශේෂ, අමරකෝශ ආදි කෝශ ග්‍රන්ථ ආශ්‍රයෙන් **වාරිවාහ, ධාරාධර, ජලධර, ජලද, වාරිද, අම්බුභෘත්, ජලමුච්, පයෝධර, අම්භෝධර, නීරද, අම්බුද, තෝයද, අම්බුවාහ, වාරිමසි** ආදි කොට ඇති, මේඝය උදෙසා භාවිත කැරෙන වචන සමුදායක් අප අබිමුව තබයි. **වලාහක, ජීමූත, ශ්වේතනීල, ධූමයෝනි, මුදිර, ව්‍යෝමධූම, ඝනාඝන, වායුදාරු, නභස්චර, කන්දර, ගගනධ්වජ, නභෝගජ, ගදාම්බර** යන වචන භාවිත කොට ඇත්තේ ජලය නොදරන වලාකුළ හැඳින්වීම සඳහා ය. මේඝය හෙවත් වැහි වලාකුළ උදෙසා භාවිත සෑම නමක් සමග ම ජලාර්ථවාචී **වාරි, ධාරා, ජල, අම්බු, පයස්, තෝය** ආදි වචන යොදා තිබීමෙන් පැහැදිලි වන්නේ එය යි.[2]

කාලිදාස කවියා තුළ වැහිවලාකුළ උදෙසා පමණක් **මේඝ** යන්න භාවිත කළ යුතු බව සහ වැසි නොවස්වන වලාකුළු උදෙසා ඒ නම භාවිත කළ නොහැකි ය යන අවබෝධය විය. ඔහුගේ **මේඝදූතය** වලාහකදූතය, වායුදාරුදූතය, නභස්චරදූතය බඳු නමක් නොලබන්නේ එහෙයිනි. මේ අතර **ශබ්දකල්පද්‍රුමය** මේඝප්‍රතිබද්ධ පද්‍ය රාශියක් විවිධ සංස්කෘත මූලාශ්‍රයන්ගෙන් උපුටා දක්වයි. එහි එක පද්‍යයක බහුරූපවත් වූ ඝෝර ස්වරූප ඇති ගොරබිරම් හඬ ඇති වැහිවලාකුළ අහස් ගැබ පිරවූ බව සඳහන් ය.[3] තවත් පද්‍යයක මහා ඕඝයක් මෙන් මේඝය වර්ෂණය කරමින් ඝෝර වූ අයහපත් වූ සියලු ගිනි නසන බව කියැවෙයි.

> **"තතස්තේ ජලදා වර්ෂං වර්ෂන්තීහ මහෞඝවත් -**
> **සුඝෝරමශිවං සර්වං නාශයන්ති ච පාවකම්"**[4]

අග්නිය නැසුණු කල්හි වසර සියගණනක් පුරා රැස්වුණු මහාජලපරිශ්‍රවය කරණ කොට ගෙන ජලය ම සම්භවය කොට ඇති වලාකුළු ය, මහපොළොව මත පැතිර යන්නේ.[5] වැසි වලාකුළේ මෙහෙවර වන්නේ සියලු ජීවීන්ගේ හිතසුව පිණිස හාත්පස හැසිරීම යි. **'සර්වභූතහිතාර්ථාය...වර්ෂති'**[6] යන වචන රැගත් පද්‍යයේ සමුදයාර්ථය

2. එම.
3. එම.
4. එම.
5. එම.
6. එම.

වන්නේ එය යි. වැසි වලාකුළෙහි උත්පත්තිය **අග්නිජා, බ්‍රහ්මජා** සහ **පක්ෂජා** වශයෙන් ත්‍රිවිධාකාර ය.[7] එම මූලාශ්‍රයට අනුව වලාකුළ ගින්නෙන් ද බ්‍රහ්මගෙන් ද පක්ෂයෙන් ද වෙන වෙන ම හට ගනියි. වලාකුළු, ජලය ඒ ඒ තැන්වලට ප්‍රදානය කරමින් ඒ ජලය රඳවා ගන්නා ස්ථානය අනුව විවිධ ස්වරූප ගන්වයි. නදියකට වැටෙන ජලය නදී ස්වරූපය ද වැවකට වැටෙන ජලය වැවේ ස්වරූපය ද ගන්නා පරිද්දෙනි. **'අනේකරූපසංස්ථානාඃ පූරයන්ති මහීං ජලෛඃ'**[8] යන කාව්‍යෝක්තියේ අර්ථය එය යි.

සංගීතශාස්ත්‍ර දෘෂ්ටිකෝණයෙන් බලන කල ද මේඝයට සුවිශේෂ ස්ථානයක් හිමි වෙයි. මේඝරාග යනු ප්‍රචලිත රාගයකි. **'ෂඩ්රාගාන්තරගතරාගවිශේෂඃ'** යනුවෙන් ප්‍රකාශිත රාග අතරට එය ද අයත් ය. **භෛරවී, වසන්ත, නට, නාරායණ, ශ්‍රීරාග** සහ **මේඝරාජ**[9] යනු එහි සඳහන් ෂඩ්රාග යි. **'බ්‍රහ්මණෝ මස්තකාත් නිර්ගතඃ'** යන පාඨයෙන් කියැවෙන පරිදි මේ ෂඩ්රාග පැමිණ ඇත්තේ බ්‍රහ්මමස්තකයෙනි. එසේ ම මෙම රාග අහසින් උපන් බවත් වැසි වසින රාත්‍ර්‍යවසානයේ එනම් ඒ උදෑසන ඒවායේ ගාන සමය වන බවත් එහි සඳහන් ය.[10] **ශබ්දකල්පද්‍රුමයේ** භෛරව, කෞශික, හින්දෝල, දීපක, ශ්‍රී රාග සහ මේඝරාජ යනුවෙන් ෂඩ්රාග ගැන සඳහන් සංගීතදර්පණාගත පද්‍යය ද ඇත.[11] ලෝචනකවිගේ **රාගතරංගිණියෙහි** භෛරවී, තෝඩී, කර්ණාට, කේදාර, යමන්, සාරංග ආදි කොට ඇති මූල රාග දොළොසට **මේඝ රාගය** ද අයත් ය.[12]

## සාහිත්‍ය විමර්ශනය

මේඝය පිළිබඳ වන නිර්වචන සහ විග්‍රහ ගවේෂණයේ දී **ශබ්දකල්පද්‍රුමය** වෙසෙසින් වැදගත් වෙයි. රාජා රාධා කාන්තදේව විසින් සම්පාදිත **ශබ්දකල්පද්‍රුමයේ** තෘතීය කාණ්ඩයේ 776-778

7. එම.
8. එම.
9. එම.
10. එම; 776, 777 පිටු.
11. එම; 777 පිටුව.
12. අභයසුන්දර; විමල්: සංගීත සංහිතා, කොළඹ, 1963, 174, 175 පිටු.

පෘෂ්ඨත්‍රයේ තන්නිරුක්ති සහ විග්‍රහ විද්‍යමාන ය. **අමරකෝශ, ශබ්දරත්නාවලී, රත්නමාලා, ත්‍රිකාණ්ඩශේෂ** යන කෝශ ග්‍රන්ථයන්ගෙන් ගත් මේඝ පාරිභාෂික පද ද **ශබ්දකල්පද්‍රුමයේ** අන්තර්ගත ය. එසේ ම මේඝ භාවිත සංස්කෘත සාහිත්‍ය ග්‍රන්ථ රාශියක උද්ධෘත ද එහි දෘශ්‍යමාන ය. **ජ්‍යෝතිතන්ත්‍ර, කූර්මපුරාණ, බ්‍රහ්මාණ්ඩපුරාණ, කල්කිපුරාණ, සංගීතශාස්ත්‍ර, සංගීතදර්පණ, හාරාවලී, ශබ්දචන්ද්‍රිකා, ශබ්දමාලා, රාමායණ, මහාභාරත, උත්තරරාමචරිත, ශිශුපාලවධ, භාවප්‍රකාශ** ආදි ග්‍රන්ථාන්තරයන්ගෙන් ගත් මේඝ සාංකල්පික උද්ධෘත ඊට නිදර්ශන යි.

මේඝය පිළිබඳ පාරිභාෂික වචන ගවේෂණයෙහිලා **ශ්‍රී සෝරත නාහිමියන්ගේ ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, හරිශ්චන්ද්‍ර විජයතුංගගේ මහා සිංහල ශබ්දකෝෂය, සිංහල නාමාවලිය, චාල්ස් කාටර්ගේ A Sinhalese – English Dictionary, ජේ. බී. දිසානායකගේ Encyclopadia of Sinhala Language and Culture** යන ග්‍රන්ථ වැදගත් විය. පාලි සාහිත්‍යාගත ව මේඝ සංකල්පය අධ්‍යයනය කිරීමේ දී **ථෙර-ථෙරීගාථා, සංයුත්ත නිකායගත මේඝසූත්‍ර, අංගුත්තර නිකායගත ඇතැම් සූත්‍ර, ඉතිවුත්තක පාළිය, සුත්තනිපාත, අපදානපාළි, ජාතකපාළිය** තත් සංකල්පය අන්තර්ගත පූර්ව සාහිත්‍ය මූලාශ්‍රය වශයෙන් හඳුනාගත හැකි විය. සංගීත දෘෂ්ටි කෝණයෙන් මේඝය අවලෝකනය කරන විට විමල් අභයසුන්දරගේ **සංගීත සංහිතා** ග්‍රන්ථයේ ඇති උපයෝගීතාව ද පෙනී ගියේ ය.

එස්. පරණවිතානගේ **Sigiri Graffiti** ග්‍රන්ථයත් සම්මානිත මහාචාර්ය පී.බී. මීගස්කුඹුර ලේඛනාවලී ග්‍රන්ථයත් වැදගත් වූයේ ඒවායේ දක්නට ලැබෙන මේඝ සංකල්පය පිළිබඳ සදෘශ මෙන් ම විසදෘශ අදහස් තත් සංකල්පය පිළිබඳ වෙනත් අවලෝකනවලට ද ඉඩ සැලසූ බැවිනි. එසේ ම තත් සංකල්පාගත පූර්ව නිර්මාණ අධ්‍යයනයේ දී අපට හංස සන්දේශය මෙන් ම සැළලිහිණි සන්දේශය ද උපකාරී විය. කොළඹ කවිය ආශ්‍රයෙන් මේඝය පිළිබඳ වන අධ්‍යයනයේ දී එච්. ඇම්. කුඩලිගමගේ **කුණාටුව** සහ ඈ යන කාව්‍ය ග්‍රන්ථ දෙකත් විමලරත්න කුමාරගම කවියාගේ නිර්මාණ ඇතුළත් පී. බී. අල්විස් පෙරේරා විසින් සංගෘහීත විමලරත්න කුමාරගම ග්‍රන්ථයත් භාවිතයට ගන්නා ලදී. පශ්චාත් නූතන කවිය ආශ්‍රයෙන් තත් සංකල්පය විවරණය කිරීමේ දී භාවිත කරන ලද්දේ කණිෂ්ක

මහේන්ද්‍ර විජයරත්නගේ **වැස්ස ඉන්නෙත් උණ අරන්** සහ ලක්ශාන්ත අතුකෝරලගේ **අමාවකේ සඳක් සිඹිමි** යන කාව්‍ය ග්‍රන්ථ ද්වය යි. ගීතාශ්‍රිත ව මේඝ සංකල්පය අධ්‍යයනය කිරීමෙහි ලා **මහගම සේකර හංස ගීතය සහ තවත් නිර්මාණ, මහගම සේකරගේ ගීත, මහගම සේකර නොපළ ගීත** යන ග්‍රන්ථ ත්‍රය ද සුනිල් ආරියරත්නගේ **අරුන්දතී, මකරන්ද, ළා හිරු දහසක්** සහ **තුටු පඬුරු** යන ගීත සංග්‍රහ චතුර්ථය ද රත්න ශ්‍රී විජේසිංහගේ **වංකගිරිය අරණේ, සුදු නෙළුම, ආලකමන්දා, නිකිණි වැස්ස** යන ගීත සංග්‍රහ චතුර්ථය ද භාවිතයට ගන්නා ලදී.

මේඝ සංකල්පයේ පූර්ව දෘශ්‍යමාන ගවේෂණයෙහි ලා **ඍග්වේද සංහිතාව, ඍග්වේද ගීතාවලී, ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාග මේ ශාස්ත්‍රීය සංග්‍රහය 1999** සහ **ආතර් ඇන්තනී මැක්ඩොනල්ගේ A Vedic Reader For Students** යන ග්‍රන්ථ භාවිත කැරිණ. මේඝදූතයට අමතර වශයෙන් ලෞකික සංස්කෘත සාහිත්‍ය මූලාශ්‍රය ඔස්සේ මේඝ සංකල්පය විවරණය කිරීමෙහි ලා භාවිතයට ගන්නා ලද්දේ **රාමායණය, ඍතුසංහාරය, ජානකීහරණය, දශකුමාරචරිතය** සහ **ගීතගෝවින්දය** යි. **මේඝදූතය** මෙහි ප්‍රධාන මූලාශ්‍රයක් වූ බැවින් එම්. ආර්. කාලේ විසින් සම්පාදිත **The Meghaduta of Kalidasa, with the Commentary (Sanjivani) of Mallinatha** නම් ග්‍රන්ථයත් වටගෙදර විමලබුද්ධි හිමියන් විසින් සම්පාදිත **මහාකවිකාලිදාසවිරචිතමේඝදූත විස්තරාර්ථ සහිත පදගත සන්නයත්** වෙසෙසින් භාවිතයට ගනු ලැබිණ.

## පර්යේෂණ ක්‍රමවේදය

ගුණාත්මක එළඹුමකින් යුක්ත මෙම පර්යේෂණයේ ප්‍රධාන වශයෙන් විශ්ලේෂණාත්මක ක්‍රමවේදය භාවිත කැරිණ. පර්යේෂණ ක්‍රමවිධි වශයෙන් තේමාත්මක විශ්ලේෂණයත් පඨිත විශ්ලේෂණයත් තුලනාත්මක විශ්ලේෂණයත් භාවිත ය. පර්යේෂණයේ උද්ගාමී තර්කනය හෙවත් පහළ සිට ඉහළට තර්ක කිරීමත් නිගාමී තර්කනය හෙවත් ඉහළ සිට පහළට තර්ක ගොඩනැගීමත් සිදු විය. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිත කරන ලද අතර ආනුභවික නිරීක්ෂණ ද යොදාගන්නා ලදි.

# ප්‍රතිඵල හා සාකච්ඡාව

## 01. පාලි භාෂා සාහිත්‍යාගත මේඝය ප්‍රතිබද්ධ සංක්ෂිප්ත විග්‍රහය

පාලි භාෂා සාහිත්‍යයේ වර්ෂාව උදෙසා වන බහුල භාවිතය වන්නේ **දේව** යි. එය අහස, වැස්ස, දේවතාවා හෙවත් දෙවියා, රජ යන අරුත්වල ද යෙදේ. **වස්සති දේවෝ යථා සුගීතං - වැස්ස සොඳුරු ගීතයක් සේ වසියි**[13] යන ථෙරගාථා පාඨය ඊට නිදසුනි. සංයුත්ත නිකායගත මේඝසූත්‍ර ද[14] අංගුත්තර නිකාය ද අපට මේඝය සම්මුඛ කරවයි. අංගුත්තර නිකායේ සූත්‍රයකට අනුව ගල්මුදුනෙක දළ පොද ඇති මේඝයක් වස්නා කල, ඒ දිය නිම්න තිබූ සේ පෙරළෙමින් අවුත් පර්වත කන්දර පදර ශාඛා පුරවයි. අනතුරුව ගල්කඳුර පැළී ඇලි පිරෙයි. ඒවා කුඩා හෙප් පුරවන අතර එසේ පිරුණු කුඩා හෙප් මහ හෙප් පුරවාලයි. මහහෙප් කුඩා නදීන් ද කුඩා නදීහු මහා නදීන් ද පුරවති. ඒ මහා නදීහු සමුදුර පුරවති. **උපරිපබ්බතේ ථුල්ලඵුසිතකේ දේවේ වස්සන්තේ** වශයෙන් ආරබ්ධ එම පාලි පාඨය සෞන්දර්යාත්මක මේඝ යෝජනයකට නිදසුනි.[15]

අංගුත්තර නිකායේ වලාහක වග්ගයේ පඨමවලාහක සූත්‍රය සහ දුතියවලාහක සූත්‍රය වශයෙන් සූත්‍ර දෙකකි. තන්නිකාය වැසි වලාකුළ පිළිබඳ පාලි සාහිත්‍යාගත බෞද්ධ සමාජයේ ප්‍රචලිත ප්‍රකාශයක් මුණ ගස්වයි.

> **"ගජ්ජිතා නෝ වස්සිතා වස්සිතා නෝ ගජ්ජිතා නෙව ගජ්ජිතා නෝ වස්සිතා ගජ්ජිතා ච වස්සිතා."**[16]

13. ථෙර-ථෙරීගාථා පාළි: 1. 6. 1 - 4, 5. 1. 3 පරි: කරහම්පිටිගොඩ සුමනසාර හිමි; ඛුද්දකනිකාය; බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 28; බණ්ඩාරගම, 2005, 24, 106 පිටු.
14. සංයුත්ත නිකාය පඤ්චම භාගය (1) 1.14 29-32, 33-36 මේඝසූත්‍ර; බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා -17; බණ්ඩාරගම, 2006, 114-117 පිටු.
15. අංගුත්තර නිකාය ප්‍රථම භාගය: 3. 2. 5. 4 සූත්‍රය; බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා - 18; බණ්ඩාරගම, 2006, 432, 433 පිටු.
16. අංගුත්තර නිකාය; ද්විතීය භාගය: 4. 3. 1. 1 පඨමවලාහක සූත්‍රය සහ 4. 3. 1. 2 දුතියවලාහක සූත්‍රය 4. 3. 1. 2 බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 19; බණ්ඩාරගම, 2006, 196 - 201 පිටු.

ඇතැම් වලාකුළක් ගර්ජනය කරන නමුදු වැසි වැස්වීමට අසමත් ය. ඇතැම් වලාකුළක් වැසි වස්වන මුත් ගර්ජනා නොකරයි. තවත් වලාකුළක් ගර්ජනය නොකරයි, වැසි ද නොවස්වයි. තවත් වලාකුළක් ගර්ජනය කරන අතර වැසි ද වස්වයි. මෙය වලාකුළක ස්වභාව ප්‍රකාශනයකි; මානව චරණ පිළිබඳ ගැඹුරු විග්‍රහයකි.

ඛුද්දකනිකායේ ඉතිවුත්තක පාලියේ එන **වුට්ඨී සූත්‍රයේ** අන්තර්ගත බුද්ධ දේශනාවට අනුව මෙලොව ජීවමාන පුද්ගල චරිත ත්‍රයකි. ඒ **අවුට්ඨිකසම, පදේසවස්සී** සහ **සබ්බත්ථාභිවස්සී** ය. අවුට්ඨිකසම යනු නොවස්නා වැහි වළාවක් බඳු පුද්ගලයා ය. පදේසවස්සී හෙවත් ප්‍රදේශවර්ෂී යනු කිසියම් ප්‍රදේශයකට පමණක් වැසි වස්වන කෙනා ය. සබ්බත්ථාභිවස්සී හෙවත් සර්වත්‍රාභිවර්ෂී යනු හැමතන්හී වස්නා වලාවක් බඳු පුද්ගලයා ය.[17] සුත්තනිපාතාගත ධනිය සූත්‍රයේ එන ධනිය ගෝපාල නම් ධනවතා මේඝයට අභියෝග කරමින් පවසන්නේ, තමා සිදු කළ බත් කිස ඇති හෙයින් ද දෝනා ලද කිරි ඇති හෙයින් ද මිහි ගංතෙර සිය අනුචරයන් සමග වාසය ඇති හෙයින් ද ගිනි දල්වා ඇති හෙයින් ද සිය වාසගෘහය සෙවෙණි කරන ලද හෙයින් ද කැමති නම් වසින ලෙස ය.[18] මෙයට පිළිතුරු දෙමින් බුදු රජාණන් වහන්සේ මේඝයට, තමා නොකිපෙන ස්වභාව ඇති බැවින් ද පහව ගිය හුල් ඇති බැවින් ද මිහිගංතෙර ඒකරත්තිවාස බැවින් ද හදකුටියේ කෙලෙස් නැති බැවින් ද විවෘත වූ බැවින් ද අග්නිය සන්සිඳුණු බැවින් ද **මේඝය කැමති නම් වසින්න** යන අර්ථය දෙන **අථ චෙ පත්ථයසි පවස්ස දේව**[19] යන වචන වදාරති. මේ බුද්ධ වචනය යි.

ථෙර ථෙරී ගාථා පාළියේ සුභූති ථෙර ගාථාවෙහි සිය ජීවිතය නමැති කුටිය සංවෘත බැවින් වා පීඩා නොමැති බැවින් හිත සුසමාහිත බැවින් වෙසෙසින් මිදුණ බැවින් වෙරවත් බැවින් කිසිවකට බාධා කළ නොහැකි බව කියැවෙයි. එහෙයින් උන් වහන්සේ රිසි සේ

17. ඉතිවුත්තකපාළි: 3.3.6 වුට්ඨී සූත්‍රය, ඛුද්දකනිකාය ප්‍රථම භාගය: බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා - 24; බණ්ඩාරගම, 2006, 406 - 409 පිටු.
18. සුත්ත නිපාතය 1. 2 ධනිය සූත්‍රය; පරි: පරවාහැර සිරි පඤ්ඤානන්ද හිමි; ඛුද්දකනිකාය ප්‍රථම භාගය: බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා - 25; බණ්ඩාරගම, 2006, 6 පිටුව.
19. එම; එම 6-11 පිටු.

වසින්නැයි මේඝයට පවසති.[20] එසේ ම උපාලි ස්ථවිර අපදානයේ මේඝය වර්ෂණය කරයි යන අර්ථය දෙන **මේඝො පවස්සති**[21] යන යෙදුම හමු වෙයි. ජාතකපාළි මූලාශ්‍රයේ මේඝය ගර්ජනා කරව යන අර්ථය දෙන **අභිත්ථනය පජ්ජුන්න**[22] යන ප්‍රකාශය මච්ඡ ජාතකයේ අන්තර්ගත ය. වෙස්සන්තර ජාතකයේ වනවාසී ජීවිතයක් උදෙසා වන අරණ වෙත යන වෙසතුරු රජු අමතා චේතවාසීන් පවසන්නේ ඔබට නිල් වලාකුළක් බඳු නිරතුරු පලාවන් ගණබිම් ඇති මල් රුකින් යුත් පල රුකින් යුත් වන ලැහැබට ගොදුරු කැමැති සිංහයකු මෙන් පිවිසෙන ලෙස යි. **සො වනං මේඝසංකාසං ධුවං හරිතසද්දලං**[23] ආදි වශයෙන් ආරබ්ධ ගද්‍ය පාඨයේ අර්ථය එය යි.

## 02. සිංහල භාෂා සාහිත්‍යාගත මේඝය හැඳින්වීම සහ සම්භාව්‍ය සාහිත්‍යයික මේඝ ප්‍රකාශන

ශ්‍රී සුමංගල ශබ්දකෝෂයේ වැසි වලාකුළ උදෙසා **පයෝධර, මෙග,** සහ **මේඝ** යන වචන භාවිත ය. මේඝනාමපූර්වක **මේඝාගම, මේඝකාල, මේඝකූට, මේඝගර්ජනා, මේඝධ්වනි, මේඝනාද, මේඝපටල මේඝපාද, මේඝමාරුත, මේඝමාලා, මේඝමුඛ, මේඝරාජී, මේඝවර්ෂ, මේඝවිවර, මේඝශීර්ෂ, මේඝශ්‍රේණි**[24] යන වචන ද එහි දෘශ්‍යමාන ය. තච්ඡබ්දකෝශය යථෝක්ත වචන දක්වන්නේ ඒවා යෙදුණු ධර්මප්‍රදීපිකාව, බුත්සරණ, මුවදෙව්දාවත, ස්තූපවංශය, සද්ධර්මරත්නාවලී, දළදා සිරිත යනාදි සම්භාව්‍ය සිංහල ග්‍රන්ථවල අදාළ පෘෂ්ඨාංක ද උපුටා දක්වමිනි. විදේශයකින් මෙරටට පැමිණ සිංහල භාෂා සාහිත්‍යය හදාළ කාටර් පියතුමා ද වලාකුළ හා බැඳුණු

20. ථෙර-ථෙරී ගාථාපාළි: 1. 1. 1 පරි: කරහම්පිටිගොඩ සුමනසාර හිමි; ඛුද්දකනිකාය; බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 28-29; බණ්ඩාරගම 2006, 2 පිටුව.
21. අපදාන පාළි- ථෙර අපදාන ප්‍රථම භාගය 6. උපාලි ථෙරාපදානය පරි: තලල්ලේ ධම්මානන්ද හිමි; ඛුද්දකනිකාය; බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 36; බණ්ඩාරගම, 2006, 74 පිටුව.
22. ජාතක පාළි: ප්‍රථම භාගය; මච්ඡ ජාතකය, අනු මඩිහේ සිරි පඤ්ඤාසීහ නාහිමි; බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 30; බණ්ඩාරගම, 2006, 30 පිටුව.
23. ජාතක පාළි: තෘතීය භාගය; වෙස්සන්තර ජාතකය, අනු මඩිහේ සිරි පඤ්ඤාසීහ නාහිමි; බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 32; බණ්ඩාරගම, 2006, 396 පිටුව.
24. ශ්‍රී සුමංගල ශබ්දකෝෂය (සිංහල-සිංහලාර්ථ) ද්විතීය භාගය; වැලිවිටියේ ශ්‍රී සෝරත ස්වාමීන්ද්‍රයන් වහන්සේ, කොළඹ, 1970, 556, 797, 797 පිටු.

වචන රාශියක් වෙත සිය අවධානය යොමු කරයි. **මේකුළ, මේඝ අඳුර, මේඝකාල, මේඝ ගර්ජනය, මේඝ චින්තකයා, මේඝ ධාරාව, මේඝ පාදය, මේඝ ධ්වනිය, මේඝ පුෂ්පය, මේඝ භූතිය, මේඝ රාවය**[25] බඳු වචන රාශියක් යථෝක්ත ශබ්දකෝශයේ අන්තර්ගත ය. මෙහි භාවිත **මේඝ චින්තක** කාටර් ඉංග්‍රීසියට පරිවර්තනය කරන්නේ thinker of rain or rain disirer වශයෙනි.[26] ඒ පිළිබඳ සාවධාන වද්දී අපට සිහිපත් වන්නේ මේඝ චින්තකයකු වූ භාරතීය සාහිත්‍යධර රබීන්ද්‍රනාත් තාගෝර් ය. මන්ද තාගෝර් යනු මේඝප්‍රිය, වර්ෂා කාලය ගැන ගීත මෙන් ම කාව්‍ය රචනා කළ මේඝ චින්තකයකු බැවිනි.

මහා සිංහල ශබ්දකෝෂයේ මේඝය උදෙසා භාවිත වචන අතර පිළිවෙළින් **අම්බුද, අම්බුධර, අඹක, ජලධර, නීරද, පයෝධර, මෙ කුළ, මේ, මේකුළු** සහ **මේඝ**[27] යන ඒවා ද වෙයි. තව ද සිංහලයේ වලාකුළ යන අර්ථය දෙන **මේ** යන්න මුලින් දී අපර පද එක්විමෙන් සැදෙන වදන් කිහිපයක් තිබේ. ඒ අනුව මේ කල් යනු මේඝ කාලය යි; මේ කැල යනු වලාකුළු සමූහය යි; මේ ගජ යනු මේඝය නමැති හස්තියා ය; මේකුළ යනු වලාකුළ යි; මේගබ් යනු මේඝ ගර්භය යි. මේ ගැජුම් යනු මේඝ ගර්ජනය යි; මේගිරි වෙහෙර යනු මේඝගිරි විහාරය යි; මේගොස් යනු මේඝ ඝෝෂාව යි; මේතුටු යනු මේඝයට තුටු වන්නා එනම් මොනරා යි; මේරජ යනු දික් වූ වලාකුළ හෙවත් මහවලාකුළ යි; මේ වන් යනු මේඝ වර්ණය එනම් නීල වර්ණය යි.

මේ අතර සිංහල නාමාවලිය දෙව්පියවුරු, මේ වලා, මේග ආදි නම් සමග අපට මේඝය සම්මුඛ කරන්නේ වෙයි.

**"පොද දියබිඳු නම් වේ දනු වැසි පොදට-**
**නිලි නම් වේ මේගෙනුපන් ගනඳුරට**
**තුසර නිහර පිනි හිම නම් දනු හිමට -**
**සිසර සිහිල් ඇල් හිම නම් වෙ සිසිලට"**[28]

---

25. A Sinhalese – English Dictionary by Charles Carter, Colombo, 1965, 512, 513 pp
26. Ibid; 512 p.
27. ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය; සම් හරිශ්චන්ද්‍ර විජයතුංග, කොළඹ, 2015, 135,137,754,1047,1408,1413,1414 පිටු.
28. සිංහල නාමාවලිය සය වන පරාක්‍රමබාහු මහරජතුමාගේ අමාත්‍ය නල්ලූර්තුනයා විසින් විරචිතයි. එච්. වී. ජී. සෝමසිරි ජයවර්ධන; කොළඹ, 2004, 20, 21 පිටු.

සිංහල කවීන් සහ සංස්කෘත කවීන් සිය සන්දේශ යැවීම සඳහා දූතයන් තෝරා ගැනීමේ දී කටයුතු කොට ඇති ආකාරයේ වෙනස ගැන ජේ.බී. දිසානායක විද්වතා කතා කරයි. ඒ සිංහල කවියා සිය දූතයන් වශයෙන් පක්ෂීන් යොදා ගැනීමෙන් සහ සංස්කෘත කවියා මේඝය බඳු සොබාදහමේ දෘශ්‍යමාන වස්තුවක් තෝරා ගත් බව කීමෙනි.[29] එහෙත් පසුකාලීන ව සංස්කෘත කවියා ද සිංහල කවීන් මෙන් ම සිය සන්දේශහරණයෙහි ලා පක්ෂීන් තෝරා ගැන්මේ ප්‍රවණතාවට යොමු ව තිබේ. රූපගෝස්වාමිගේ **හංසදූතය** සහ කර්තෘ අවිනිශ්චිත **පිකදූතය** ඊට නිදර්ශන යි.

සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ මේඝය හෙවත් වලාකුළ ගැන කියැවෙන තැන් රැසකි. පී. බී. මීගස්කුඹුර විද්වතා කව්සිළුමිණේ 9 වැනි සර්ගයේ එන අදහස් ද හකුලා දක්වමින් පවසන්නේ භාරතීය කාව්‍යවල මේඝ ඍතුව (මේ කල්) ගැන ඇති වර්ණනා බොහෝවිට සෞභාග්‍යය, සමෘද්ධිමත් භාවයේ සංකේත බව යි. ප්‍රේම සංගම සිදු වන මෙම කාලය වැසි වලාබර අහස, දලුලන රුක්ලිය, අහස පුරා සිටින කොක් රැන්, බිඟුන් ගැවසි නියඟලා මල්, ගස් වසා සිටින කණාමැදිරියන්, පොළොවෙහි ඉදිගොව්වන් ආදි රමණීය පරිසරයේ සජීවී බව පෙන්වන අවධියක් බවත් ගොවීන් සිය ගොවිබිම් සඳහා වැසි අපේක්ෂාවෙන් සිටින කාලයක් බවත් කියයි.[30] සීගිරි ගී අතුරින් ද අපට මේඝය හමු වෙයි. එහි 244 වැනි කවිය ඊට එක් නිදසුනකි. 'මෙය නොදැනුවත්වම දැන් මා ඇස් හමුවට ආ බව කියති. වර්ෂා සමයෙහි (rainy season) පවන් සමග සිහින් වැසි පොද සෙයින් සිතුවිලි එක්ව නැගී ආයේ ය' ආදි අරුත් දෙන පරිදි සෙනරත් පරණවිතාන විසින් ඉංග්‍රීසියට නගා ඇති පරිවර්තනය ඊට නිදර්ශන යි.

**"නොජැනි ම ඇස්හි මෙය් සිත් එක්වන් ආ නු යෙති
මහමෙයැ ගැනැ සෙය්නි ආ සිහිල් පැනිත්තක් පවන්"**[31]

---

29. Encyclopadia of Sinhala Language and Culture J. B. Disanayaka, Colombo, 2017, p 442.
30. සම්මානිත මහාචාර්ය පී.බී. මීගස්කුඹුර ලේඛනාවලීඃ සංස්ඃ දඹුල්ලේ සුදේව හිමි, පිටතලාවේ විමලසාර හිමි, අපරැක්කේ සිරිසුධම්ම හිමි, දෙහිවල, කොළඹ, 2012, 1081 පිටුව.
31. Sigiri Graffity¦ S. Paranavitana, London, 1956, 149 p.

යථෝක්ත පද්‍යයට කළ එම පරිවර්තනය සමග එකඟ නොවන පී.බී. මීගස්කුඹුර, මෙහ 'මහමෙ' යන්න සැලකිය යුත්තේ වැසි සමය වශයෙන් නොව 'වැහි වලාකුළ' වශයෙන් යැයි කියයි.[32] මන්ද 'වැහි වලාකුළ' මෙහි දී ගැඹුරු අරුතකට ඉඩ සලසන බැවිනි. මාර්ගිකයා සීගිරිය සොයා එන්නේ වැසි වලාකුළක් පාවෙමින් එන ලෙසිනි. සිය ගමනාරම්මණය ඇස ගැටුණු පසු වැහි වලාකුළක් කන්දක හැපුණු විට සීතල වැහි බිඳු පිටතට වැගිරෙන්නාක් මෙන් ඔහුගේ අදහස් පිටාර ගලන්නට වෙයි. ගමන් විඩාවට පත් මිනිසකු සීගිරියට පැමිණීම වැහි වලාකුළක් කන්දක් වෙත පැමිණීම මෙනි.

සම්භාව්‍ය සිංහල සාහිත්‍යයට අයත් සන්දේශ සාහිත්‍යයේ වලාකුළු යෝජන රාශියක් ඇතත් ඒ සියල්ල ම වාගේ නියෝජනය කරන්නේ වලාකුළ මිස වැහි වලාකුළ නොවේ. හංස සන්දේශයේ **නොපටු වලා කුළු, සරද වලා, සඳ වෙල ගිනිදැල්**[33] ඊට නිදසුනි. මෙහි අවසන කී සඳ වෙල ගිනිදැල් යනු සන්ධ්‍යා වලාකුළු නමැති අග්නිජාලාව යි. සැළලිහිණි සන්දේශයේ වැඩි වශයෙන් ඇත්තේ ද වලාකුළ මිස වැහි වලාකුළ නොවේ. එහි එන **සඳ යුරු සඳවෙලෙන් රැඳි රුසිරු මනරම**[34] යන කාව්‍යෝක්තියේ සරලාර්ථය වන්නේ සන්ධ්‍යා වලාකුළින් රඤ්ජිත වූ සඳ බඳු ආකාර ඇත්තේ යන්න යි. **සැඳෑ වලා පෙළ පැළඳිග පෙනුණු පසු**[35] පද්‍යයෙන් කියැවෙන්නේ ද සන්ධ්‍යා වලාකුළ මිස මේඝාර්ථදායී වැසි වලාකුළ නොවේ.

## 03. සිංහල සාහිත්‍යාගත මේඝ සංකල්පය කොළඹ කවි, පශ්චාත් නූතන කවි සහ ගීත

කොළඹ යුගයේ කවීන් අතුරින් වැසි වලාකුළ සිය කාව්‍යයන් රසවත් කරන යෝජනයක් මතු නොව කාව්‍ය සංකේතයක් වශයෙන්

32. සම්මානිත මහාචාර්ය පී.බී. මීගස්කුඹුර ලේඛනාවලීඃ සංස්ඃ දඹුල්ලේ සුදේව හිමි, පිටතලාවේ විමලසාර හිමි, අපරැක්කේ සිරිසුධම්ම හිමි, දෙහිවල, කොළඹ, 2012, 584 පිටුව.

33. හංස සන්දේශය 17, 69, 101 පද්‍ය සම්ඃ ඊ. තෙන්නකෝන්, කොළඹ, 1955, 17, 58, 78 පිටු.

34. ශ්‍රී රාහුල හිමි විරචිත සැළලිහිණි සන්දේශයඃ 42 පද්‍යය; ශ්‍රී ධර්මාරාම සංශෝධනය; ශ්‍රී ප්‍රඥාසාර සංස්කරණය, කැලණිය, 2018, 84 පිටුව.

35. එම; 50 පද්‍යය; 94 පිටුව.

භාවිතයට ගත් කවීන් අතුරින් එච්. ඇම්. කුඩලිගම කවියාට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි. මෙහිලා ඔහුගේ කාව්‍ය නිර්මාණ අතුරින් විශේෂ වන්නේ **ඇ** සහ **කුණාටුව** යි. **කුණාටුවේ** ප්‍රථම පද්‍යය ඇරඹෙන්නේ **'ගැබිනියකගේ තන පුඩුවල පැහැය උරා - පාවෙන වලාකුළු පවතියි අහස පුරා'**[36] යන කාව්‍යෝක්තියෙනි. පයෝධර යනු ද වලාකුළට නමකි. මේ වූකලී රූපසාම්‍යය මෙන් ම ගුණ සාම්‍යය ගැන සතිමත් ව ලියන ලද කවියකි. වලාකුළු අර්ථවාචී පයෝධර වියලි මහපොළොව ජල සම්පතින් පෝෂණය කරයි. මාතෘත්වයට භාග්‍යවන්ත වූ ස්ත්‍රිය සිය පයෝධරයන් වෙතින් ගලා එන කිරෙන් මිනිස් දරුවා පෝෂණය කරයි. වැහිවලා දකින මිනිස් සිතක ඇති වන ප්‍රහර්ෂය කවියා මෙසේ ප්‍රකාශයට පත් කරයි.

> **"ඇළ දොළ ගලා බස්වන්නට ඉවුරු කඩා -**
> **ගොඩබිම නිවා සනහන්නට සියලු විඩා**
> **ගණ වැහි වලා ඉගිලී එන විටදි අඬා -**
> **මට මහ සොම්නසක් ඇත! මොනරකුට වඩා"**[37]

**කුණාටුව** කාව්‍ය ග්‍රන්ථයේ **ගස් වැල් තිගැස්සෙයි මේ කුළු නැගෙන හඬින්**[38] **හැම වැහි වලාවම ඉගිලී ගෙන එද්දී**[39] යන කාව්‍යෝක්ති මේඝ යෝජනයට නිදර්ශන වෙයි. **වලාකුළු පෙරහැර** නමින් **ඇ** කාව්‍ය සංග්‍රහයේ දක්නට ලැබෙන පද්‍ය පසළොසකින් සමන්විත කවි පන්තිය ආරම්භ වන්නේ අහසේ පියාඹන මහ බලඇණිය යන ආමන්ත්‍රණය මේඝයට යොදමිනි.

> **'දිය වැල් ගීතවත් කොට ගිරි දුදුළු හිසේ - අහසේ පියාඹන**
> **මහ බල ඇණිය මෙසේ'**[40]

වලාකුළ සම්බන්ධ කොට ගෙන ජීවිතයට සමීප හෘදයංගම අත්දැකීම් කොළඹ යුගයේ තවත් කවීන් කිහිප දෙනෙකුන් විසින් ද ප්‍රකාශයට පත් කොට ඇත. ඒ අතර විමලරත්න කුමාරගම විශේෂ වෙයි.

---

36. එච්. ඇම්. කුඩලිගම: කුණාටුව; නව සංස්කරණය, ගීතනාත් කුඩලිගම, කොළඹ, 2013, 3 පිටුව.
37. එම.
38. එම; 4 පිටුව.
39. එම.
40. එච්. ඇම්. කුඩලිගම: ඇ; කොළඹ, 2013, 37 පිටුව.

ඔහු ජීවත් වූ කාලයේ ප්‍රේමය වේවා, විරහ වේදනාව වේවා ප්‍රකාශයට පත් කිරීමෙහි ලා වන ප්‍රබල මාධ්‍යය වූයේ කවිය යි. එහෙත් ඔහුගේ නිර්මාණ අධ්‍යයනයේ දීත් පෙනී ගියේ වැසි වලාකුළ යන අර්ථය දෙන මේඝ යෝජන අල්ප බව ය. '**වැහිබර වලා ඔරවන ගොරවන රුදුරු**'[41] යන්න මේඝයට දිය හැකි එක් නිදසුනකි. එහෙත් වැඩි වශයෙන් ඇත්තේ **වලාකුළක, සැන්දෑ වලාවල, වලාකුලක් ඇද, සුදු වලා පෙති, සරද සඳ සුදු වලා යුවළක්**[42] යන යෙදුම් මිස මේඝාර්ථවාචී වැසි වලාකුළ සිය කවියට හසු කොට ගත් අවස්ථා නොවේ.

මේඝ සංකල්පය නූතන කවීන් විසිනුදු සිය භාවිතයට ගත් බව පෙනේ. මෙහි දී නූතන යුගයේ සමාරම්භක යුගයට අයත් කවීන්ගේ නිර්මාණ අතර ද මේඝ සංකල්පය භාවිත කාව්‍ය නිර්මාණ රැසක් භාවිත ය. එහෙත් මෙහි දී පශ්චාත් නූතන කවි යුගය නියෝජනය කරන කවීන් දෙදෙනකුගේ පමණක් නිර්මාණ වෙත සාවධාන වන්නේ අධ්‍යයනයේ පහසුව සහ සීමාව සලකා ය. පළමු ව කනිෂ්ක මහේන්ද්‍ර විජයරත්න විසින් දිනකර හා මිහිකත වැහි අඳුර ගත් මේඝකූටයට සම්බන්ධ කරමින් ලියූ පහත සඳහන් කවියට අවධානය යොමු කරනු ලබන්නේ ඒ අනුව ය. මෙහි දී කවියා තමා භාවිතයට ගන්නා රූපක වේවා කාව්‍ය වස්තු වේවා මිහිකත වේවා ඒ සියල්ලට කිසියම් ජීවමාන භාවයක් ආරෝපණය කිරීමෙහි ලා යොමු වෙයි.

**දෑත දිගු කර වැළඳ ගන්නට බලන් ඉන්නව දිනකරත්**
**කන්ද උඩහින් කර තියාගෙන වැහි අඳුර ගත් මේ කුළත්**
**මාස දෙක තුන හතර විඩකින් නො නා හිටියට මිහිකතත්**
**කවුරු දන්නෙද වැටෙන තුරු අද වැස්ස ඉන්නෙත් උණ අරන්**[43]

ලක්ශාන්ත අතුකෝරල වැසි වලාකුළු නිසා ලැබෙන වර්ෂාව ගැන අර්ථවාහී පද්‍යයක් මෙසේ සමාජගත කරයි.

---

41. අල්විස් පෙරේරා පී. බී. : විමලරත්න කුමාරගම; කැලණිය, 1963, 117 පිටුව.
42. එම; 110, 150, 166, 196, 198 පිටු.
43. විජයරත්න; කනිෂ්ක මහේන්ද්‍රඃ වැස්ස ඉන්නෙත් උණ අරන්, බොරලැස්ගමුව, 2018, 35 පිටුව.

**හීන් හඬින් බිඳු බිඳු කොට සදා තනික දිය මහිමය**
**මහ පොළොවට ගලා බසින සාර සිහිනයේ ජීවය**
**මත් සම කොට - රුක එළි වැට ලැබ ආදරයේ රිද්මය**
**ඔබයි සොබාදහම ලියූ අති උත්තම හොඳම කවිය**[44]

තිලකසිරි ප්‍රනාන්දු ගායනවේදියාණන්ගේ හඬින් අද දවසේත් ඇසෙන කරුණාරත්න අබේසේකර ලියූ **එන්න මදනලේ** ගීතයේ කියැවෙන්නේ විරහී පෙම්වතකු සිය පෙම්වතියට සිය හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා මදනල දූතයකු කොට ගත් ආකාරය යි. කාලිදාස, මේඝය සිය ප්‍රේම පණිවිඩය ගෙන යන සම්ප්‍රේෂකයා බවට පත් කොට ගනිද්දී, අබේසේකර ඒ සඳහා මාධ්‍යය කොට ගන්නේ මදනල යි. එම ගීතය මේඝ සංකල්පය සමග සම්බන්ධ වන්නේ එහි කාලිදාසත් ඔහුගේ මේඝදූතයත් ගැන සඳහනක් වන බැවිනි.

**"ශෝක පණිවිඩය යවන්න ආදරිය බලා -**
**කාලිදාස කිවිඳු මේඝදූතයක් කළා**
**මට කොයින් ද එම වලා ආමි සුළඟෙ ඔබ බලා -**
**කියන්නකෝ මගෙ දුක ඇගෙ කණට ළංවෙලා"**[45]

මේඝ සංකල්පය භාවිතයට ගත් නිර්මාණකරුවෝ රැසක් වෙති. ඒ අතුරින් අධ්‍යයනයේ පහසුව සඳහා මහගමසේකර, සුනිල් ආරියරත්න සහ රත්න ශ්‍රී විජේරත්න යන ගේයපද රචකයන් තිදෙනාට මෙහි දී අවධානය යොමු කැරේ. මහගමසේකර නිර්මාණ අතර **'අහසේ නිල් පැහැය උරා - මේඝ වලා කඩින් පෙරා,' 'මහා වැහි වලාවක් හදිසියෙ ඇද හැලිණි**[46] බඳු කාව්‍යෝක්ති මෙන් ම **වැස්ස වහින්නට ඉස්සර අහසේ වලාකුළින් විදුලිය කෙටුවා,**[47] **මේඝ මැදින් විදුලිය මෙන් නටා දිවෙනවා**[48] ආදි ගීතෝක්ති විද්‍යමාන ය. සුනිල් ආරියරත්න

44. අතුකෝරළ; ලක්ශාන්තඃ අමාවකේ සඳක් සිඹිමි; බොරලැස්ගමුව, 2007, 63 පිටුව.
45. අබේසේකර, කරුණාරත්න, හඬ ගුවන් විදුලි සඟරාව; කොළඹ, 2014, 111 පිටුව.
46. මහගමසේකර; හංස ගීතය සහ තවත් නිර්මාණ; සම්ඃ රත්නසිරි අරංගල; වැල්ලම්පිටිය; 1982; 143,146 පිටු.
47. මහගම සේකරගේ ගීත; මහගම සේකර; කොළඹ, 1976, 50 පිටුව.
48. මහගම සේකර නොපළ ගීත; සංස්ඃ රංජිත් අමරකීර්ති පලිහපිටිය, කොළඹ, 1984, 78 පිටුව.

ගීතාවලියේ එන නව සන කුළු බිඳ නව වැසි එයි නව මල් මැද තණ තැන්නේ,[49] වැස්ස වලාහක දෙවියනි,[50] හිතමිතුරු සුළඟ ළඟ එන වැහි වලාවට කියන්[51] හතර වටින් කළු කෙරුවට, වහින්නට හැකිනම් ගිගුම් දී, මේසයක් සේ හුදෙකලා වී[52] යන ගීත සංකථනයට ලක්කළ හැකි ය. රත්න ශ්‍රී ගීතාවලියේ එන අමරදේවයන් විසින් ගයනු ලබන පුතුනේ ගීතයේ දී අපට හමුවන්නේ ඍග්වෛදික සමාජයේ පර්ජන්‍ය දේවත්වයට නගා ඇති සෙයින් දේවත්වාරෝපිත වැහි වලාකුළ යි.

"වලාහක දෙවිඳු ඉසිවර - ඇසින් බල බලා පුතු දෙස-
ඉසුරු මුනි විහාරය ළඟ අන්න හිඳිනවා"[53]

සුදුනෙළුම ගීත සංග්‍රහයේ මුරුගසන් වැසි වසින මේඝයයි, නිල් අහස වැසෙයි-කළු වලාකුළක් ඇවිදින්, මේඝවලා දැක නැගෙනා - තැති ගැනිලා[54] යන ගීතෝක්ති තිබේ. ඔහුගේ ආලකමන්දා ගීත සංග්‍රහයේ එන කවියාගේ මේඝදූතය නිර්මාණය වන්දිම් හිමි වලා[55] යන සීගිරි කාව්‍යෝක්තියෙන් සමාරබ්ධ ව අපට සම්මුඛ කරවන්නේ ද මේඝ සංකල්පය යි. එසේ ම එහි මල් මංගල්ලය නම් ගීතයේ දෘශ්‍යමාන මේඝ ලතාවෙනි කම්පිත වූ සත නිවා දමන්නේ, මේඝ ලතාවෝ - දෙරණට ආවෝ[56] යන යෝජන ද මේඝ සංකල්පය හා සම්බන්ධ ය. එසේ ම රත්න ශ්‍රී පවසන්නේ මහාමේඝ හෙණ අකුණු විලාපය ඇසෙන මොහොතේ රන් දඹ රුක වන්නේ අම්මා බව යි. මහාමේඝ හෙණ අකුණු විලාපේ - රන් දඹ රුක මයෙ අම්මා[57] යන නිකිණි වැස්ස ගීත සංග්‍රහයේ දෘශ්‍යමාන ගීතෝක්තිය ඊට නිදර්ශන යි. මේ අතර මේ කුළු නැඟී විගස - පැරෙයි අකුණු සරින[58] යන ගීතෝක්තිය ඇත්තේ ද ඔහුගේ නිකිණි වැස්සේ ය.

---

49. ආරියරත්න; සුනිල්: මකරන්ද; කොළඹ, 2000, 27 පිටුව.
50. ආරියරත්න; සුනිල්: අරුන්දතී; කොළඹ, 1975, 40 පිටුව.
51. ආරියරත්න; සුනිල්: ළා හිරු දහසක්; කොළඹ, 1978, 110 පිටුව.
52. ආරියරත්න; සුනිල්: තුටු පඬුරු; කොළඹ, 1994, 31, 36, 120 පිටු.
53. විජේසිංහ; රත්න ශ්‍රී: වංකගිරිය අරණේ; නුගේගොඩ, 2002, 43 පිටුව.
54. විජේසිංහ; රත්න ශ්‍රී: සුදු නෙළුම; නුගේගොඩ, 2004, 37, 51, 67 පිටු.
55. විජේසිංහ; රත්න ශ්‍රී: ආලකමන්දා; නුගේගොඩ, 2007, 114 පිටුව.
56. එම; 119 පිටුව.
57. විජේසිංහ; රත්න ශ්‍රී: නිකිණි වැස්ස; කොළඹ, 2012, 28 පිටුව.
58. එම; 42 පිටුව.

## 04. මේඝ සංකල්පය පිළිබඳ වෛදික සාහිත්‍ය ප්‍රවණතා

ඍග්වේදාගත ජල සූක්ත අතර එන එක් සූත්‍රයක **'අපාං නපාත්'** නමින් දෙවියෙක් නිරූපිත ය. ඉන්ධනයකින් තොර ව තමා ම දැල්වෙන, විදුලිය නමැති වස්ත්‍රයෙන් සැරසුණු රන්වන් පැහැයෙන් යුතු මේ **අපාං නපාත්** අග්නිගේ ස්වරූපයක් ලෙස ද දක්වා තිබේ. ඔහු සැඟ ව සිටින තැන වන්නේ වලාකුළු ය.[59]

සොබාදහමේ අපූර්ව නිර්මාණයක් වන අග්නි හෙවත් ගින්න තුළ දෙවියන් දුටු කවියා ඒ දෙවියන් වර්ණනා කිරීමේදී යොදා ගත්තේ ද සොබාදහමේ වස්තූන් ය. හිරු, වලාකුළ, විදුලිය, අහස, පොළොව සහ ජලය වැනි සොබාදහමේ අංග, අග්නි හා අතිසමීප ලෙස සම්බන්ධ කොට දක්වා තිබීමෙන් පැහැදිලි වන්නේ එම සත්‍යය යි. පර්ජන්‍ය දේව සංකල්පය පිළිබඳ වන පහත සටහන මේඝ සංකල්පය ගැන වන සඳහනකි.

> **"උදෑසන හිරු තුළ, දැල්වෙන ගින්න තුළ ආලෝකය දුටු ඍග්වේද කවියා විදුලි රේඛාවක චමත්කාරයෙන් මත් ව බියමුසු බැතියකින් ඒ දෙස බැලුවේ ය. වලාකුළක සුන්දරත්වය සහ අසිරිය ද දුටුවේ ය. මේ දැකීම ය, ඍග්වෛදික කවියා තුළ 'පර්ජන්‍ය දේව සංකල්පය' ජනිත වීමට ඉවහල් වූයේ. පර්ජන්‍ය යනු වැහි වලාකුළ යි. ඊට සංස්කෘත භාෂාවෙන් 'පයෝධර' යයි ද කියනු ලැබේ. මේ පයෝධර යන වචනය පියයුරු යන අරුත් හි ද යෙදෙයි. 'පයස්' සහ 'ධර' යන පද ද්වයේ සමවායෙන් පයෝධර යන වචනය සෑදෙයි. 'පයස්' යන්නෙහි ජලය සහ කිරි යන අරුත් ඇත. 'ධෘ' ධාතුවෙන් සෑදෙන 'ධර' යන්නෙන් අදහස් වන්නේ දැරීම යි. මේ අනුව ජලය දරන තැන යන අරුතින් වලාකුළ පයෝධර නම් වන අතර කිරි දරන තැන යන අරුතින් පියයුරු පයෝධර නම් වෙයි. මේ දෙකින් ම සිදු වන්නේ පෝෂණය පිළිබඳ වන විශිෂ්ට කාර්යය යි. වලාකුළ සිය ජලයෙන් වැසි වස්වා මහ පොළොව නමැති දරුවා පලවැලින්**

59. Macdonell, Arthur Anthony, A Vedic Reader For Students, Madrass, 1957, pp 67, 68.

> **යුතු කොට සශ්‍රීක කරයි. මාතාව ද සිය කිරි දී දරුවන් පෝෂණය කිරීමේ උදාර කාර්යය ඉටු කරයි. පර්ජන්‍ය දේව සංකල්පය මේ සියල්ල කැටි කොට ගත් චින්තාවක් වූ බව පෙනේ.”**[60]

පර්ජන්‍යගේ සුවිශේෂ ලක්ෂණය වන්නේ වැසි වැස්වීම යි. ඒ වූකලී වලාකුළු මෙහෙවර යි. පර්ජන්‍ය පියකු වැන්න. ශාක නිෂ්පාදකයා මෙන් ම පෝෂකයා වන්නේත් පර්ජන්‍ය යි. මිනිස් කාන්තාවන් තුළ පමණක් නොව ගව දෙනුන්, වෙළඹුන් වැනි සත්ත්ව ජීවිත තුළ සශ්‍රීකත්වය ඇති කරන්නේත් ඔහු ය. මිහිකත ඔහුගේ බිරිඳ යි. ඔහුගේ සෙනෙහස එක තැනක නොරැඳී මුළු මහත් මිහිකත වෙත ගලා යයි. මෙසේ මිහිකත වෙත වර්ෂාව රැගෙන එන දයාබර ස්වාමියා වන්නේ පර්ජන්‍ය යි. ඔහු වර්ෂාව ගෙන දී මහී කාන්තාව තුළ ජීවය තැන්පත් කරයි. මේ සොබාදහමේ සුන්දර වූත් අර්ථවත් වූත් ක්‍රියාවලිය තුළ කවියා දේවත්වය දකියි.[61] මේඝය හා බැඳුණු පහත සඳහන් වර්ෂා ගීත අර්ථය තුළ ඇත්තේ ද උස් තැන් හා මිටියාවත් සම කරන වෛදික කවියා තුළ වූ ගැඹුරු වූත් දයාබර වූත් සොබාදම් ලැදි චින්තාව යි.

> **"ගිගුරුම් දෙනු මැනවි. හෙණ පුපුරුවනු මැනවි. ජීව බීජය තැන්පත් කරනු මැනවි. ජලයෙන් බර වූ රියෙන් වටේට ඉගිලෙනු මැනවි. ලිහන ලද ජල පසුම්බිය පහළට අදිනු මැනවි. උස් තැන් ද මිටියාවත් ද සම වේවා!”**[62]

වර්ෂාවෙන් පසු ඇති වූයේ සශ්‍රීකත්වය යි. ‘වැසි වැස ඇත’ යන අරුත දෙන ‘**වර්ෂං අවර්ෂීඃ**’ යන සුන්දර කාව්‍යෝක්තිය වෛදික කවි සිත පිළිසිඳුණේ එහෙයිනි. වැසි වලාකුළු මිහිකත මත මුදා හළ වර්ෂාව නතර වූ පසු කවියා හාත්පස බලයි. ඔහුට දක්නට ලැබෙන්නේ වියලි බිම් ජල බිම් බවට පත් ව ඇති ආකාරය යි. ඒ අනුව කවියා පවසන්නේ දැන් කාන්තාර පවා ජල බිම් බවට පත් ව ඇති බව ය. භෝජනය සඳහා පැළෑටි ද වැවී තිබේ. දැන් මේ පර්ජන්‍ය වෙත

---

60. සොබාදහම තුළ දෙවියන් දුටු ඍග්වේද කවියා; සමන් චන්ද්‍ර රණසිංහ, ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම ශාස්ත්‍රීය සංග්‍රහය 1999 සංස් තෙරිපැහැ සෝමානන්ද හිමි ඇතුළු තවත් අය, පන්නිපිටිය, 1999, 174 පිටුව.

61. එම; 175 පිටුව.

62. ඍග්වේද v. 83 7 ඍග්වේද ගීතාවලී; නාරාවිල පැට්රික්, කොළඹ, 1997, 152 පිටුව.

මෙසේ ප්‍රදානය කැරෙන්නේ වර්ෂා ප්‍රදානය උදෙසා මානව ප්‍රජාව වෙතින් ලැබෙන අභිනන්දන ගීතය යි.

**"අවර්ෂීවර්ෂමුදු ෂු ගෘභායා - කර්ධන්වාන්‍යත්යේතවා උ**
**අජීජන ඕෂධීර්භෝජනාය කම් - උත ප්‍රජා භ්‍යාවිදෝ මනීෂාම්"**[63]

## 05. මේඝදූත වියුක්ත සංස්කෘත සාහිත්‍යාගත ග්‍රන්ථ පඤ්චකයක් ආශ්‍රයෙන් මේඝ සංකල්ප ගවේෂණය

සංස්කෘත සාහිත්‍යාගත ආදි කාව්‍යය වන **රාමායණය** වලාකුළ සමාන කරන්නේ ලෝකය උදෙසා අපරිමාණ මෙහෙවරක නිරත ව ලොවට සදර්ථ ප්‍රදානය කොට වියැකී යන සාධු ජනයන්ට ය. ලෝකය මනා වැස්සෙන් සතුටු කරවා, නදී තට පුරවා, මිහිකත පිරුණු සස්‍ය ඇත්තක් කොට, වලාකුළු අහස අතහැර නැසෙතියි යන සුසංකල්පය වාල්මීකී ඍෂිවරයා මෙසේ ඉසොඳුරු කාව්‍යෝක්තියක් බවට පත් කරයි.

**"ලෝකං සුවෘෂ්ට්‍යා පරිතෝෂයිත්වා - නදීස්තටාකානි ච පූරයිත්වා නිෂ්පන්නසස්‍යාං වසුධාං ච කෘත්වා - ත්‍යක්ත්වා නභස්තෝයධරාඃ ප්‍රණෂ්ටාඃ"**[64]

රාමායණයේ **'වේෂ්ටිතං මේරුශිඛරේ සතෝයමිව තෝයදම්'**[65] යන පාඨයෙන් කියැවෙන පරිදි රාවණ සම කරනු ලැබ ඇත්තේ මේරු පර්වතයේ දෘශ්‍යමාන සජල වලාකුළකට යි.

**ඍතුසංහාර** සංස්කෘත ඛණ්ඩ කාව්‍යයේ වර්ෂා ඍතුව පිළිබඳ වර්ණනා අතර වැසි වලාකුළ උදෙසා භාවිත වචන යෙදුණු පද්‍ය කිහිපයක් අපට හමු වෙයි. සිංහල පරිවර්තනයත් සමග මෙහි දක්වනු ලබන පද්‍යය විශේෂ වන්නේ එහි වලාකුළ හා සාම්‍යයක් දක්වන ජීව අජීව වස්තූන් සමග එය සමාන කොට ඇති බැවිනි.

---

63. ඍග්වේද v. 83. 10 ඍග්වේදසංහිතා - ද්විතීය භාගඃ; ශ්‍රීමත් සායනාචාර්ය විරචිත භාෂ්‍යසමේතා, සංස්: එන්. එස්. සොන්තක්කේ සහ තවත් අය, පූනා, 1936.
64. රාමායණ iv.30.57 ශ්‍රීමද්වාල්මීකීරාමායණම්;මූලමාත්‍රම්, සංස්: රාමනාරායණදත්තශාස්ත්‍රී, ගෝරඛ්පූර්, 1963.
65. එම; රාමායණ v.49.14

**"නිතාන්තනීලෝත්පලපත්‍රකාන්තිභිඃ-**
**ක්වචිත් ප්‍රභින්නාඤ්ජනරාශිසන්නිභෛඃ**
**ක්වචිත් සගර්භප්‍රමදාස්තනප්‍රභෛඃ-**
**සමාචිතං ව්‍යෝම ඝනෛඃ සමන්තතඃ"**[66]

කිසියම් තැනක අතිශය නිලුපුල් පත් කාන්තියෙන් යුතු වලාකුළුවලින් ද තව තැනක වෙසෙසින් බිඳුණු අඳුන් රැසක් බඳු වලාකුළුවලින් ද තවත් තැනක ගැබ් ගත් කාන්තාවකගේ පියයුරු පැහැයෙන් යුතු වලාකුළුවලින් ද අහස හාත්පස ගැවසී ගන්නා ලදී.

**ඍතුසංහාරයේ** වර්ෂා ඍතු වර්ණනයේ සමාරම්භක පද්‍යයේ පොද දිය සහිත වලාකුළු මතැතුන්ට සමාන කැරෙන **'සශීකරාම්භෝධරමත්තකුඤ්ජරඃ'**[67] යන කාව්‍යෝක්තිය ඇත. එහි තෙවැන්න වලාකුළු ගැන ම ලියැවුණු පද්‍යයකි. පිපාසයෙන් පීඩිත කැඳැති පක්ෂීන් විසින් අපට ජලය දෙවයි යන ආයාචනයට අනුව බොහෝ සෙයින් ජලය වර්ෂණය කරන්නා වූ මනහර හඬැති වලාකුළු සෙමින් සෙමින් ගමන් කරන බව එහි සඳහන් ය.

**"තෘෂාකුලෛශ්චාතකපක්ෂිණාං කුලෛඃ -**
**ප්‍රයාචිතා තෝයභරාවලම්බිනඃ**
**ප්‍රයාන්ති මන්දං බහුධාරවර්ෂිණෝ -**
**බලාහකාඃ ශ්‍රෝත්‍රමනෝහරස්වනෛඃ"**[68]

මෙයට අමතර වශයෙන් **මේඝවාචී** වචන වන **පයෝමුච්, පයෝධර, අම්භෝධර, ජලමුච්, තෝයද, ජලධර**[69] යන වචන ද **ඍතුසංහාරයේ** දෘශ්‍යමාන ය.

**කුමාරදාසයන්ගේ ජානකීහරණයේ** ස්ථාන රාශියක **මේඝ** යන වචනය හෝ එහි පාරිභාෂික යෙදුම් හෝ හමු වෙයි. එහි ප්‍රථමාංකයේ එක් පද්‍යයක අර්ථය වන්නේ සරත්කල සුදු වලාකුළු, තුඟු මතුමහලෙහි කොබෝගෙඩි වළල්ල වැළඳ, මිහිඟුබෙරවල දෙන ලද ස්වකීය හඬ ඇති සිය ධ්වනි ඇත්තේ ප්‍රාසාද කාන්තියේ බෙදීම කැමති වන්නේ ය යන්න යි.

66. ඍතුසංහාර ii. 2 The Rthusamhara of Kalidasa with Sanskrit Text, edited by Shastri Vyankatacharya Upadhye & M.R. Kale, Delhi, 1997, page 15.
67. ඍතුසංහාර II.I.
68. ඍතුසංහාර II.3.
69. ඍතුසංහාර II.10, 16, 19,21,22,27.

**"ආලිංග්‍ය තුංගං වඩභී විටංකං විශ්‍රාණිතාත්මධ්වනිපුෂ්කරේෂු
යත් සෞධකාන්තේරිව සංවිභාගඃ වව්‍රේ සිතං ශාරදමභ්‍රවෘන්දම්"**[70]

මන්ථවාතයෙන් කරකැවෙන වලාකුළ යන අර්ථය දෙය **'මන්ථවාතභ්‍රමන්මේඝ'**[71] යන යෙදුම ද ලංකාවේ අකාලයේ පවා වලාකුළු ගැඹුරු කොට ගර්ජනා කරන්නේ යන අර්ථවාචී **'ධීරං ගර්ජන්ති ලංකායාමකාලේ වාරිදා'**[72] යන යෙදුම ද **ජානකීහරණ**යෙන් සමු වෙයි. . එසේ ම පිළිවෙළින් **ජලදා, වාරිදං, කෘෂ්ණමේඝ සහ අසිතවාරිද, මේඝ, අම්බුද, ජලධර, ජලදකාල, පයෝධර, ජලධරස්‍ය, ජලධරේ, වාරිදශීකර, ජලදෝදයේ, වාරිදේ, පයෝමුචි, මේඝස්‍ය හෘදයේ, පයෝද කාලස්‍ය, පයෝධරස්පර්ශ**[73] යන යෙදුම් ද එහි විද්‍යමාන ය.

දණ්ඩීකෘත දශකුමාරචරිතයේ ප්‍රථමෝච්ඡ්වාසයේ එන රාජවාහන කුමරුන්ගේ හඬ **'අභ්‍රනිර්ඝෝෂගම්භීරේණ ස්වරේණ'**[74] යන වචන යොදමින් කවියා සමාන කරන්නේ මේඝ ගර්ජනාවකට යි. මේ අතර එහි නිල් වලාකුළු කරණ කොට ගෙන මහත් වූ අන්ධකාරයෙන් ඝන ව වැසී ගිය රාජ වීදියක රාත්‍රී දර්ශනයක් ගැන වර්ණිත වන්නේ **"නීලනීරදනිකරපීවරතිමිරනිබිඩිතායාං රාජවීථ්‍යා..."**[75] ආදි වශයෙනි. තව ද එහි සැතපෙන රාජ කන්‍යාවක සම කරනු ලැබ ඇත්තේ සරත් සමයේ වලාකුළ නමැති උකුළෙහි නිදන විදුලියට යි.[76] එහෙත් ඒ වලාකුළ මිස වැසි වලාකුළ නොවේ.

ශ්‍රී ජයදේවකෘත **ගීතගෝවින්ද**යේ සමාරම්භක පද්‍යයේ 'මේකුළෙන් අහස සිතිඳු ව ඇත' යන අර්ථය දෙන **'මේඝෛර්මේදුරමම්බරං'**[77] යන්න ඇත. අනතුරුව ශ්‍රී කෘෂ්ණ දෙවියන්

---

70. ජානකීහරණ I.9 ශ්‍රී කුමාරදාසකෘත ජානකීහරණ මහාකාව්‍යය; සංස්: රත්මලානේ ශ්‍රී ධර්මාරාම නා හිමි, මහරගම, 1963, 4 පිටුව.
71. ජානකීහරණ II.13 එම; 34 පිටුව.
72. ජානකීහරණ II. 66 එම; 45 පිටුව.
73. ජානකීහරණ II.26, V.29, VIII.90, IX.5, XI.40,41,46,48,52,60,80,81,83,92 XII.12,13. එම; 81, 104, 171, 176 - 231, 237, 238, 241, 247 පිටු.
74. ශ්‍රීමද්දණ්ඩින්විරචිත දශකුමාරචරිත; උත්තරපීඨිකාඃ කේ. බී. ජයවර්ධන සහ පුස්සැල්ලාවේ ඤාණරතන හිමි, කොළඹ, 2017, 59 පිටුව.
75. එම 92 පිටුව.
76. එම 134 පිටුව.
77. ගීතගෝවින්ද I.I.I ශ්‍රී ගීතගෝවින්දම්ඃ සම්ඃ මහාරාජ් දීන් දීක්ෂිත; බරණැස, 1951, 3 පිටුව.

ඇඳි වත **'වසනං ජලදාභං'**[78] වශයෙන් වලාකුළකට සම කැරේ. වරෙක කෘෂ්ණ දේව නව වලාකුළ යන අර්ථය දෙන **අභිනව ජලධර**[79] යනුවෙන් ආමන්ත්‍රිත ය. තව වරෙක කෘෂ්ණ ලලාටය ගන වළා සුමුයෙක සැලෙන සඳු පරයන සඳුන් තිලක සාම්‍යයෙන් ගෙන හැර දක්වා ඇත.[80] තවත් තැනෙක කියැවෙන්නේ රාධා කෘෂ්ණ යැයි සිතා අනල්පතිමිර ජලධරයක්[81] එනම් ගන අඳුරු වලාකුළක් සිප වැළඳ ගත් බව යි. ගීතගෝවින්දයේ එක් තැනක කියැවෙන **'සජල ජලද සමුදය රුචිරේණ'**[82] යන ගීතෝක්තියේ දී කෘෂ්ණ සම කරනු ලැබ ඇත්තේ දිය සහිත වලාවක් පැහැසර ලෙස උදාවන ආකාරයට යි.

## 06. මේඝ සංකල්පය පිළිබඳ සංස්කෘත සාහිත්‍යාගත උපරි ප්‍රකාශනය කාලිදාසයන්ගේ මේඝදූතය

**මේඝදූතයේ** මේඝය ම මූලය කොට ගනිමින් ඊට අදාළ සමස්ත සංසිද්ධිය විවරණය කැරේ. සමීප වර්තමානයේ යථෝක්ත කෘතියට වටගෙදර විමලබුද්ධි හිමියන් විසින් කරන ලද ප්‍රාමාණික සිංහල පරිවර්තනයේ එන දීර්ඝ ප්‍රස්තාවනාවේ සඳහන් වන පරිදි ශ්‍රී ලංකාවේ කෝට්ටේ යුගයේ දී රචිත සියලු සංදේශ කාව්‍යයන්ට පූර්වාදර්ශය වූයේ මේඝදූතය යි. එසේ ම පශ්චාත්කාලීන සංස්කෘත සාහිත්‍යය තුළ පහළ වූ සියලු දූත කාව්‍යයන්ට පූර්වාදර්ශය වූයේ ද මේඝදූතය යි.[83] මේඝදූතයේ කියැවෙන පරිදි එක්තරා යක්ෂ ගෝත්‍රික පෙම්වතෙක් සිය රාජ කාර්යයෙහි වූ ප්‍රමාදයක් කරණ කොට ගෙන සිය සෙන්පතියාගෙන් රාමගිරි අසපුවට ඔහු පිටුවහල් කිරීමෙහි ලා වන දඬුවම ලබයි. එම දඬුවමට අනුව පෙම්වතාට පුරා වසරක් එහි නැවතී සිටීමට සිදු වෙයි. මේ වූ කලී පෙම්වතා පෙම්වතියගෙන් දීර්ඝ කාලයකට දුරස් කිරීමකි. එය මේ විරහනීය පෙම්වතුන් යුවළට දරාගත නොහෙන අසීරු අත්දැකීමක් වෙයි. වර්ෂා ඍතුව සමීප වද්දී

78. ගීතගෝවින්ද I.I.8 එම; 8 පිටුව.
79. ගීතගෝවින්ද I.2.7 එම; 11 පිටුව.
80. ගීතගෝවින්ද II.5 එම; 24 පිටුව.
81. ගීතගෝවින්ද VI.6 එම; 58 පිටුව.
82. ගීතගෝවින්ද VII.35 එම; 73 පිටුව.
83. මහාකවිකාලිදාසවිරචිතමේඝදූත විස්තරාර්ථ සහිත පදගත සන්නසඃ සම්ඃ වටගෙදර විමලබුද්ධි හිමි, නුගේගොඩ, 2024 xxxvi, xxxvii පිටු.

පෙම්වතාට සිය පෙම්වතිය සිහිපත් වෙයි. එහෙත් ඔහුට ඇය වෙත පෙම්පතක් හෝ වෙනයම් පණිවිඩයක් හෝ යැවීමට ක්‍රමයක් නැත. මෙසේ විරහ වේදනාවෙන් පීඩිත පෙම්වතා කිසියම් අස්වැසිල්ලක් ලබන්නේ අහසේ පාව යන වැහි වලාකුළක් දැකීමෙනි. ඒ මේඝය ම සිය දූතයා කොට ගනිමින් සිය පෙම්වතියට පණිවිඩයක් යැවිය නොහැකි ද යන කල්පනය පෙම්වතාගේ සිතෙහි ඇති වෙයි. මුළු මහත් මේඝදූතය පුරා අන්තර්ගත ව ඇත්තේ මේ පෙම් පණිවිඩය යි.

මේඝදූතය **පූර්ව මේඝය** සහ **උත්තර මේඝය** වශයෙන් ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත ය. උත්තර මේඝයෙහි අන්තර්ගත පද්‍ය සංඛ්‍යාව සැට දෙකකි; උත්තර මේඝයෙහි පද්‍ය පනස් දෙකකි. සමස්ත කෘතිය හුයක් මෙන් එකිනෙකට සම්බන්ධ කරන්නේ මේඝය යි. අපට මේඝදූතයේ දී කවියා පළමුවෙන් මේඝය මුණ ගස්වන්නේ පූර්වමේඝයේ ද්විතීය පද්‍යයේ දී ය. ඒ ඇසළ මස පළමු දිනයෙහි වැළඳගත් සානුව ඇති ඉවුරු බිඳීමෙහි ලා දක්ෂ වූ ඇතකු මෙන් දර්ශනය වන වලාකුළක් දුටු බව කීමෙනි.

**"ආෂාඪස්‍ය ප්‍රථමදිවසේ මේඝමාශ්ලිෂ්ටසානුං -**
**වප්‍රක්‍රීඩාපරිණතගජඃ ප්‍රේක්ෂණීයං දදර්ශ"**[84]

කාලිදාසයන්ගේ කවිතාවෙහි සුවිශිෂ්ට ලක්ෂණයකි, සොබාදහම තුළ සත්ත්ව ස්වභාව සහ මානව චරණ දැකීමේ ප්‍රවණතාව. මේඝාලෝකය හෙවත් මේඝය දර්ශනය වන කල්හි සුවසේ හිඳින දනන් සිත වුව විකෘතියට පත් වෙයි. එහෙයින් වෙනදා ආදරයෙන් වැළඳගත් චරිතයෙන් දුරස් වූ කල්හි එබඳු තැනැත්තකු ගැන කියනු ම කවරේ දැයි අසයි. ඒ වූකලී වලාකුළ සහ විරහි ජනයන් අතර ඇති සහසම්බන්ධතාව අතර ඇති අවියෝජනීයත්වය ප්‍රකාශයට පත් කිරීමකි.

**"මේඝාලෝකේ භවති සුඛිනෝප්‍යන්‍යථාවෘත්ති චේතඃ**
**කණ්ඨාශ්ලේෂප්‍රණයිනි ජනේ කිං පුනර්දූරසංස්ථෙ"**[85]

84. මේඝදූත 1. 2 The Meghaduta of Kalidasa, with the Commentary (Sanjivani) of Mallinatha edited with a literal English Translation by M. R. Kale, Bombey, 1934 page 5.

85. මේඝදූත 1.3 page 9.

වර්ෂා සමය විරහ වේදනාව අත්‍යුත්සන්න ව දැනෙන කාලය බැවින් වර්ෂාවේ දූතයාට ම සිය පෙම්වතියගේ ප්‍රාණය දරා ගන්නා ශක්ති ප්‍රදායකයා වෙන්නැයි කියයි. මෙහි දී වර්ෂාව හැඳින්වීම සඳහා සංස්කෘත භාෂාවේ යෙදෙන එක් වචනයක් වන්නේ ශක්තිනී ය. මේ සංවේදනීය අවස්ථාවේ දී පෙම්වතා සිය පෙම්වතිය සනසන්නට සිතන්නේ තමා සුවසේ හිඳින්නේ ය යන පණිවිඩය එනම් ස්වකුශලමයී ප්‍රවෘත්තිය ඇය වෙත මේඝය මගින් සම්ප්‍රේෂණය කිරීමට සැලැස්වීමෙනි. එහෙත් පෙම්වතා පිළිබඳ සත්‍යය වන්නේ ඔහු සතුටින් නොව අතිමහත් විරහ වේදනාවෙන් පීඩිත ව සිටින බව යි. අභිනව කුටජ කුසුමින් පුද ලද මේඝයට ප්‍රීතිපූර්වක වදන් පවසමින් හදවතේ නැති සතුට ඇති බවක් මවා පෙන්වන්නේ එහෙයිනි.[86]

මේඝදූතයෙහි නිරූපිත පෙම්වතා යනු සප්‍රාණ ජීවීන් සහ අප්‍රාණ වස්තූන් පිළිබඳ වෙනස මනාසේ අවබෝධ කොට ගත්තෙකි. එහෙත් ජීවිතයේ තීරණාත්මක අවස්ථාවන්හි දී කවර තැනැත්තෙක් හෝ සිය වේදනාව ප්‍රකාශ කිරීමට සමීපයේ කිසිදු ප්‍රාණියකු නොමැති නම් ළඟ ඇති අජීවී වස්තුවකට වුව සිය දුක පළ කරන්නට කටයුතු කරයි. මේඝය යනු ධූමය, ආලෝකය, ජලය සහ පවන යන සාධක සතරෙහි එක්වීම නිසා සැදෙන අජීවී වස්තුවක් බව ඔහු දනියි. එසේ ම ඉන්ද්‍රිය ශක්තිය ඇති ප්‍රාණීන් විසින් ගෙන යායුතු සන්දේශකරණය මේඝයට කළ නොහැකි බව ද ඔහු දනියි. එහෙත් කිරීමට අන් කිසිවක් නොමැති කල සිය ඉෂ්ටාර්ථ සම්පාදනය උදෙසා අජීවී වස්තූන් වෙත වුව ආයාචනා කිරීමට විරහී ජනයෝ උත්සුක වෙති. එබඳු අය චේතන අචේතන භාව නොසලකන බැවිනි.[87] මේ මානව මානසික ස්වභාවය වූ කල්හි කාල දේශ ආගම් ජාති ඈ භේදයන්ගෙන් තොර ව මෙලොව ජීවත් වූ ජීවත් වන කවර හෝ මානවයකුට දැනෙන තත්ත්වයකි. සංස්කෘත කවියා හෝ සිංහල ගේය පද රචකයා පවසන මේ මෙහෙවර වලාකුළකට හෝ සුළඟට ඉටු කළ හැකි දෙයක් ද? මෙයට කාලිදාස සිය මේඝදූතයේ දී මනා පිළිතුරක් දෙයි. ඔහු පවසන්නේ මේඝය, ඔබ ලොව ප්‍රසිද්ධ වූ පුෂ්කර ආවර්තක යන යන ශ්‍රේෂ්ඨ මේඝ වංශයෙහි ජන්මලාභය ලද කැමැති රුවක් ගත හැකි ඉන්ද්‍ර දෙවියන්ගේ ප්‍රධාන පුරුෂයා බව තමා දන්නා හෙයින්

86. මේඝදූත 1.4 page 11.

87. මේඝදූත 1.5 page 13.

දෛවානුකූල ව හෘදය බන්ධුවරියගෙන් වෙන් කරන ලද තමා ඔබ කෙරෙහි ආයාචනා කරන්නකු බවට පත් වී ඇති බව යි. ආයාචකයා විසින් ආයාචිත චරිතයේ ඇති ගුණෝත්කර්ෂය නිසා එම ඉල්ලීම ඉටුවුවත් නැතත් එහි දෝෂයක් නොවේ. එසේ ම උත්තම චරිතයකින් යම් ඉල්ලීමක් කොට ඒ නිෂ්ඵල වීම නීචයකු වෙතින් ඉල්ලීම් ඉටු කොට ගැන්මට වඩා ශ්‍රේෂ්ඨ බව ද එහි කියැවෙයි.

**"යාඥා මෝඝා වරමධිගුණේ නාධමේ ලබ්ධකාමා"**[88]

සංස්කෘත සාහිත්‍යය මේඝය සාධුජනයනට සම කරයි. තත් සාහිත්‍යාගත ප්‍රසිද්ධ ප්‍රකාශයක දැක්වෙන්නේ සජ්ජනයන් වලාකුළු මෙන් ලොව දුර්ලභ ව උපදින බව යි.

**"ජායන්තේ විරලා ලෝකේ ජලදා ඉව සජ්ජනාඃ"**[89]

මේ දුලබ වලාකුළු ය, තාපපීඩිත මෙන් ම විරහ පීඩිත ආතුර ජනයනට පිහිට වන්නේ. මේඝය සතු මේ අනාථසනාථකරණ ගුණය යි, පෙම්වතා යථෝක්ත පණිවිඩය යැවීමට මූල කාරණය වන්නේ. මෙහි දී කවියා විසින් භාවිත සන්තප්තානාං යන වචනය යටකී ද්වි අර්ථයන් සමග ම ගැනීමෙනි, අපට වඩාත් භාවසූචක අර්ථයක් මතු කොට ගත හැක්කේ.

**"සන්තප්තානාං ත්වමසි ශරණං තත්පයෝද ප්‍රියායාඃ"**[90]

මේඝය යනු ජීවිතය පිළිබඳ අපේක්ෂා දල්වන්නා ය. ආකාශ සංචාරී ඔහු දකින විට විරහිනී හදවත්වල අපේක්ෂා දැල්වෙයි. එපමණක් නොව කල්‍යාණ මිත්‍රයකු වන මේඝය දැකීමෙන් තුංග පර්වත ද මහදානන්දයකට පත් වෙයි. පෙම්වතා සිය ප්‍රේමසන්දේශහාරක මේඝයට සිය ගමන යද්දී අතරමග දී හමු වන චිත්‍රකූට පර්වතය ළඟ නැවතී ඔහු වැළඳ සමුගන්නැයි කියයි. එවිට සිත්කුළු ගිර ද කඳුළු මුදයි. මන්ද කවිසමයානුගත පර්වත යනු ජලය දැකීමෙන් මොළොක් වන කඳුළු ද මුදන සහකම්පනීය වස්තුවක් බැවිනි.

---

88. මේඝදූත 1.6 page 15.
89. පඤ්චතන්ත්‍රම්; මිත්‍රභේද; 29 පද්‍යය. Pancatantra of Vishnusharman, Kale, M.R.; 1995, p 8.
90. මේඝදූත 1. 7 page 17.

ගොවිතැනෙහි ඵල සම්පත්තියෙහි හිමිකරු වන්නේ මේඝය යි. මන්ද ජලවර්ෂක මේඝයන්ගෙන් තොර වීම යනු කෘෂිකර්මයෙහි අවනතිය වන බැවිනි. වලාකුළු දෙස ගෙවිලියන් ස්නේහපූර්වක දෑසින් බලා සිටින්නේ එහෙයිනි. මේ නිසා ම එගොවිබිම් වෙතට පහත් වී නගුලින් සී සෑම නිසා හටගත් සුවඳ මුසු කොට ගනිමින් යළි ගමනෙහි යෙදෙන්නැයි ප්‍රේමවිරහී සංසිද්ධියේ කාව්‍යප්‍රකාශක කාලිදාස කියයි.[91]

කවියා දිගින් දිගට ම මානව ජීවන චරණ පවත්නා තත්ත්වයට වඩා උත්තුංගභාවයට පත් කිරීමෙහි ලා වන ස්වහෘදයාභිලාෂයෙන් යුක්ත ව මේඝානුසාරී සංකල්ප සමාජය වෙත මුදා හරියි. කවියාට අනුව මේඝය යනු වරක් ආම්‍රකූට පර්වත බිම සිසාරා පැතිර ගිය දාවාග්නිය ජලවර්ෂණයෙන් නිවාලූ තැනැත්තා ය. ආම්‍රකූටයට සිය මේඝ මිතුරා කළ ඒ සදුපකාර අමතක නැත. එහෙයිනි, මේ සන්දේශය රැගෙන යන වලාකුළ ගිමන් නිවීම සඳහා ගිරිහිසට පහත් වූ මොහොතේ ඔහු ගෞරවයෙන් පිළිගන්නේ. ඒ කලින් උපකාර කළ මිතුරකු සරණ පතා ආවිට සාධුමිත්‍රයා කිසිසේත් ඔහුට පිටුනොපාන බැවිනි.”[92]

තමා පිළිගත් ගිර විෂයයෙහි ද මේඝය විසින් කළයුතු ප්‍රතික්‍රියාවක් වෙයි. එහෙයින් කවියා පවසන්නේ ජල වර්ෂණය කොට පර්වත ග්‍රීෂ්මයෙන් හටගත් අග්නිය නිවාලන ලෙස යි.[93] යථෝක්ත අර්ථවාචී පද්‍යය බොහෝ මේඝදූත පරිවර්තන හෝ ව්‍යාඛ්‍යා ග්‍රන්ථවල නැත. මෙය පසුකාලීන ව මේඝදූතයේ 18 - 19 යන පද්‍ය අතරට අලුතින් ඇතුළු කළ පද්‍යයක් විය හැකි ය. කාලිදාසයන්ගේ ප්‍රධාන ග්‍රන්ථ සයට ම ව්‍යාඛ්‍යාන සම්පාදනය කළ මල්ලිනාථ ද යථෝක්ත ශ්ලෝකය ගැන සඳහනක් කොට නැත.

ගමන් මල්ල සැහැල්ලු වන තරමට යන ගමන ද පහසු වෙයි. මෙය මේඝයට ද සාධාරණ ය. තමා දරා සිටින ජලය මුදා හැරීම කරණ කොට ගෙන ඔබට දැන් වඩා පහසුවෙන් ගමන් කළ හැකි යැයි කවියා පෙම්වතා ලවා වලාකුළට කියයි. **‘තෝයෝත්සර්ගාද්‍රුතතරගතිස්තත්පරං වර්ත්ම තීර්ණඃ’**[94] යන

91. මේඝදූත 1. 16 page 33.
92. මේඝදූත 1. 17 page 35.
93. වටගෙදර විමලබුද්ධි හිමි, 40 පිටුව.
94. මේඝදූත 1. 19 page 37.

කාව්‍යෝක්තියෙන් කියැවෙන්නේ මෙය යි. මේ වූකලී කායික ව සහ භෞතික ව අප්‍රමාණ භාරයන් දරා ගනිමින් ජීවන යාත්‍රාවෙහි යෙදෙන මානවයන් වෙත සිය ජීවන චරණ වෙනස් කොට ගැන්ම උදෙසා දුන් සදුපදේශයක් නොවන්නේ ද?

තදනන්තර ව කවියා මේඝයට පවසන්නේ ජලය මුදා හළ බැවින් රේවා නදියෙන් දිය පානය කොට යළි ගමන අරඹන ලෙස යි. එවිට ඇතුළත සාරවත් වූ බැවින් සුළඟට වලාකුළ චංචල කළ නොහෙන බැවිනි. බරක් ඇත්තේ ද ගෞරවය පිණිස වන්නේ ද එබඳු දෙය යි; එබඳු චරිත යි. වලාකුළ සම්බන්ධයෙන් කොට ඇති යථෝක්ත ප්‍රකාශය අපට උත්තම මානව චරණයක් වශයෙන් ද හඳුනා ගත හැකි ය.

> **"අන්තඃසාරඃ ඝන තුලයිතුං නානිලඃ ශක්ෂ්‍යති ත්වාං**
> **රික්තඃ සර්වෝ භවති හි ලඝුඃ පූර්ණතා ගෞරවාය"**[95]

සිය ප්‍රේම සන්දේශය රැගෙන උදේනී නගරය වෙත දිවෙන චාරිකාවේ දී මේඝයට නිර්වින්ධ්‍යා නදිය හමු වෙයි. ඒ නදියෙහි සරන හංස පන්තිය කවියා සමාන කරන්නේ ඒ නදී ලාලනියගේ ඉණ බැඳි මෙවුල් දමට යි. දියසුළි යනු ඇගේ නාභිය යි. ඇගේ ගමන ලලිතවත් ය. කවියා මෙහි නිරූපිත පෙම්වතා ලවා මේඝයට පවසවන්නේ සිරිඟර රස පිරි සැමියකු මෙන් ඇය දෙස බලන ලෙස යි. මෙහි දී කවියා විසින් භාවිත රසාභ්‍යන්තරඃ යන වචනය රසය ඇතුළත තබාගෙන සිටින, රසය ම අභ්‍යන්තරය කොට ඇති මෙන් ම ශාංගාර රසය ම අරුත් කොට ඇති ආදි වශයෙන් වන බහුවිධ අර්ථ සූචනය කරයි. එසේ ම සිය කාව්‍යාර්ථය එහි උපරි තලයට නංවමින් කවියා සිය කවි කුසුම සහෘදය පාඨක සංසදයට ප්‍රදානය කරන්නේ ප්‍රියයන් විෂයයෙහි ලා වන කාන්තාවන්ගේ විලාසවත් වචන ම ඔවුන්ගේ ප්‍රේම ප්‍රකාශනය ද වන බව කියමිනි.

> **"නිර්වින්ධ්‍යායාඃ පථි භව රසාභ්‍යන්තරඃ සන්නිපත්‍ය**
> **ස්ත්‍රීනාමාද්‍යං ප්‍රණයවචනං විභ්‍රමෝ හි ප්‍රියේෂු"**[96]

---

95. මේඝදූත 1. 20 page 40.
96. මේඝදූත 1. 29 page 53.

යහපත් රාජ්‍යයක් නම් සාධුජනයන් වශයෙන් හැඳින්විය හැකි පුරවැසි සම්පතට හිමිකම් කියන ජනපදවලින් සමන්විත විය යුතු ය. තදනන්තර ව මේඝය පිවිසෙන්නේ පුණ්‍යාවසානය කරණ කොට ගෙන මනුලොවට ඒමට සිදු වූ නමුත් ස්වර්ග වාසයට යෝග්‍ය ජනයන්ගෙන් යුතු අවන්තී ජනපදයට යි. එජනපදය සැලකිය යුත්තේ දෙව් ලොව ම කොටසක් ලෙස යි. මේ අනුව මෙකවි වැකි කියවද්දී එවන් ජනතාවක් ඇති දේශයක් දැක ගැන්මට මේඝය මෙන් අප ද පින් කළ යුතු නොවේ ද යන හැඟුම අප තුළ ඇති වෙයි.

**"ස්වල්පීභූතේ සුචරිතඵලේ ස්වර්ගිණාං ගාං ගතානාං**
**ශේෂෛඃ පුණ්‍යෛර්හෘතමිව දිවඃ කාන්තිමත්ඛණ්ඩමේකම්"**[97]

මෙයිනික්බිති කවියා මේඝයට පවසන්නේ උදේනී නුවර ප්‍රියයන්ගේ මන්දිර වෙත යන යුවතීනට ගණ අඳුර නිසා නිරුද්ධ වූ ආලෝකය ඇති පෘථිවී මාර්ගය සිය විදුලියෙන් ප්‍රකාශයට පත් කරන ලෙස යි. එහෙත් වැසි ජලය හෙළීමෙන් හෝ මේඝයනට ආවේණික ගර්ජනයෙන් ඔවුන් බියපත් නොකරන්නැයි ද ඉල්ලා සිටියි. මෙයින් ප්‍රකාශයට පත් වන්නේ විරහී පෙම්වතාගේ සානුකම්පී මෘදු හදවත යි.

**"සෞදාමන්‍යා කනකනිකෂස්නිග්ධයා දර්ශයෝර්වීං**
**තෝයෝත්සර්ගස්තනිතමුඛරෝ මා ච භූර්වික්ලවාස්තාඃ"**[98]

බාර ගත් වගකීම භාරදූර නම් අතරමග හමුවන සිත් අලවන තැන්වල නොරැඳී ගමන් කළ යුතු ය. බොහෝ වෙලාවක් විදුලි කොටමින් බැබළීම හේතු කොට ගෙන වෙසෙට පත් විදුලිය නමැති ප්‍රියාව සහිත ඔබ නිදිගත් පරෙවියන් ඇති මැඳුරු පියසක රැය පහන් කොට හිරු උදාවත් ම ගමනෙහි ශේෂාර්ධය සපුරාලීම උදෙසා උත්සුක වන්නැයි ආයාචනය කරයි. මන්ද මිතුරන් වෙනුවෙන් කළයුතු කාර්යය නොපමා ව ඉටු කළ යුතු බැවිනි.[99]

මේඝදූතය වරින් වර ඉසොඳුරු මේඝ සංකල්ප අප අබිමුව තබයි. එහි උත්තර කාණ්ඩයේ එන **පුෂ්පමේඝීකෘත ආත්මා** යන යෙදුම ඊට එක් නිදසුනකි. මෙය යොදා ඇත්තේ ස්කන්දකුමාර නම්

97. මේඝදූත 1. 31 page 56.
98. මේඝදූත 1. 40 page 70.
99. මේඝදූත 1. 41 page 72.

දිව්‍යමය චරිතය හැඳින්වීම සඳහා ය. දේවගිරියෙහි නිබඳ වාසය කරන එම දෙවියනට ඇත්තේ පුෂ්ප මේඝයකට පත් කරන ලද ශරීරයකි. එහි අර්ථය ස්කන්ද දෙවි සිය සිරුර කැමැති කැමැති රූපයකට පත් කොට ගැන්මේ - ශරීරය මල් වර්ෂාවක් වලාකුළු වැස්සක් බවට පත් කොට ගැන්මේ ශක්‍යතාවෙන් යුතු බව යි. ඔබ අභිෂේක කළ යුත්තේ ආකාශ ගංගා ජලයෙන් සාරවත් පුෂ්ප වර්ෂාවෙන් යයි කවියා තවදුරටත් කියයි.

**"තත්‍ර ස්කන්දං නියතවසතිං පුෂ්පමේඝීකෘතාත්මා**
**පුෂ්පසාරෛඃ ස්නපයතු භවාන් ව්‍යෝමගංගාජලාර්ද්‍රෛඃ"**[100]

මේඝය යනු මෙපරිද්දෙන් දේව ස්වරූප හා සම්බන්ධ වන්නෙකි. කවියා මේඝය හඳුන්වන්නේ ශ්‍රී කෘෂ්ණ දෙවියන්ගේ වර්ණය සොරකම් කොට ගැන්මට සමත් වූ තැනැත්තා වශයෙනි. භාරතයේ ශ්‍රී කෘෂ්ණ උදෙසා භාවිත කරන **ශ්‍යාමවර්ණ කෘෂ්ණ** යන යෙදුම ද මේ මොහොතෙහි අපගේ සිහියට නැඟෙයි. සංස්කෘත කවියා සාහිත්‍යාගත සංසිද්ධි සමාන කිරීමෙහිලා භාවිත උපමා සොයා යාමේදී මේඝ සංකල්පය ළඟ ද නැවතෙයි. කුරු ක්ෂේත්‍රයෙහි දී ගාණ්ඩීව දුන්න දරන අර්ජුන තියුණු හී සිය ගණනකින් රජවරුන්ගේ හිස් කපා හෙළීම පිළිබඳ වන සුසැඩ සිදුවීම මේඝය නෙළුම් මත උදක ධාරා ඇද හෙළීමට ඔහු සම කරයි.

**"රාජන්‍යානාං ශිතශරශතෛර්යත්‍ර ගාණ්ඩීවධන්වා**
**ධාරාපාතෛස්ත්වමිව කමලාන්‍යභ්‍යවර්ෂන්මුඛානි"**[101]

වලාකුළ පිටතින් කෘෂ්ණවර්ණ වුවත් ඔහුගේ අභ්‍යන්තරය ශ්වේත වර්ණ වෙයි. ඉන් සංකේතවත් වන්නේ මේඝයේ ආභ්‍යන්තරික පාරිශුද්ධිය යි. ඔහු සිය අභ්‍යන්තරය පවිත්‍ර කොට ගන්නේ සරස්වතී නම් දේව නදියේ ජලය පානය කිරීමෙනි. විරහිනී ප්‍රේමයක දූතයා වෙමින් මේ යන ගමනේ දී මේඝයට සරස්වතී නදිය හමු වන බව පෙම්වතා දනියි. එහෙයින් සියල්ලට පළමු සිය අභ්‍යන්තර ශුද්ධිය ඇති කොට ගැන්ම පිළිබඳ වන අරමුණින් බැහැර නොවන්නැයි ඉල්ලා සිටියි. මෙය කාලිදාස කවියා අතින් රමණීය කාව්‍යෝක්තියක් බවට පත් ව මෙසේ ප්‍රකාශයට පත් වෙයි.

---

100. මේඝදූත 1. 46 page 79.

101. මේඝදූත 1. 51 page 86.

**"කෘත්වා තාසාමධිගමමපාං සෞම්‍ය සාරස්වතීනා-**
**මන්තඃ ශුද්ධස්ත්වමපි භවතා වර්ණමාත්‍රේණ කෘෂ්ණඃ"**[102]

මෙබඳු සදුක්ති අපට මේඝදූතයේ තැනින් තැන සමු වෙයි. මෙය තත් ඛණ්ඩ කාව්‍යයෙන් වරින් වර ප්‍රකාශයට පත් වන එක් විශේෂතාවක් වශයෙන් ද හඳුන්වා දිය හැකි ය. ලැව් ගින්නෙන් දැවෙන හිමාලය වනය සිය ජල ධාරා පතනයෙන් මේඝදූතයේ කියැවෙන පරිදි වාරිධාරාසහස්‍රයකින් නිවා සනසාලිය හැක්කේ මේඝයට යි. මන්ද උත්තම චරිතවල කාර්යය වන්නේ ඔවුන් සතු සම්පත් මෙන් ම ශක්තීන් යොදා විපතට පත්වූවන් ඉන් මුදාලීම බැවිනි.[103] කවියා සිය සහෘදය චරිතවලට උපකාර කිරීම ද මේඝ මෙහෙවරට අයත් ය යන කරුණ ද පෙම්වතා මුවින් අපට දන්වයි. ඒ කෛලාශ පර්වතයට නඟින පාර්වතී දෙවඟනට එම පර්වතයේ මැණික් ඉවුරට නැඟීම පිණිස ඔබගේ මේඝ ශරීරය ඝන කොටස් බවට පත් කළ සෝපාන මාර්ගයක් බවට පරිවර්තනය කොට ගැනීමෙනි.

**"භංගීභක්ත්‍යා විරචිතවපුඃ ස්තම්භිතාන්තර්ජලෞඝඃ -**
**සෝපානත්වං කුරු මණිතටාරෝහණායාග්‍රයායී"**[104]

මේඝදූතයේ පූර්ව මේඝයට සාපේක්ෂ ව උත්තරමේඝයේ මේඝ හෝ එහි පාරිභාෂික පද හෝ දක්නට ලැබෙන්නේ අඩුවෙනි. උත්තරමේඝයේ **ජලද** සහ **අම්බුවාහං**[105] යන වචන ද්වය එසේ අඩුවෙන් වූ **මේඝාර්ථවාචී පද** භාවිතයකට නිදර්ශන යි.

යථෝක්ත උත්තරමේඝයේ මතු නොව සමස්ත මේඝදූත කාව්‍යයේ අවසානය සලකුණු කරන උත්තරමේඝාගත පද්‍යයේ **ජලද** යන මේඝාමන්ත්‍රණය අන්තර්ගත ය. එසේ ම එහි වලාකුළට මොහොතකුදු විදුලිය නමැති පෙම්වතියගෙන් ක්ෂණයකුදු විරහවක් නොවේවා යන ප්‍රාර්ථනය කරන තමා විරහයට පත් වුව ද අන්‍යයනට එබඳු තත්ත්වයක් ඇති නොවිය යුතු ය යන මානව ප්‍රේමවන්තයා අපට මුණ ගැසෙන්නේ ද එහි ය. එහෙයින් යථෝක්ත පද්‍යයේ නාද මාධුර්යය සහ අර්ථ මාධුර්යය යන දෙක සලකා විශේෂයෙන් එහි

---

102. මේඝදූත 1. 52 page 88.
103. මේඝදූත 1. 56 page 95.
104. මේඝදූත 1. 63 page 104.
105. මේඝදූත 11. 37, 39 pages 158, 161.

පෘථුලාර්ථය නිසා ම එය සිංහල පරිවර්තනය ද සමග මෙහි උපුටා දක්වනු ලැබේ.

> **"ඒතත්කෘත්වා ප්‍රියමනුචිතප්‍රාර්ථනාවර්තිනෝ මේ - සෞහාර්දාද්වා විධුර ඉති වා මය්‍යනුක්‍රෝෂබුද්ධ්‍යා**
>
> **ඉෂ්ටාන්දේශාන් ජලද විචර ප්‍රාවෘෂා සම්භෘතශ්‍රීර් - මාභූර්දේවං ක්ෂණමපි ච තේ විද්‍යුතා විප්‍රයෝගඃ"**[106]

මේඝය, සුහද බව නිසා හෝ මා කෙරෙහි ඇති කරුණාබර සිත නිසා හෝ නොගැළපෙන යම් අයැදුමක් වශයෙන් මගේ මේ සන්දේශය ගෙන යාම නම් වන කැමැත්ත ඉටු කොට වර්ෂා කාලයෙහි එක් කළ ශෝභාව සහිත වූයේ තමන් කැමැති කැමැති දේශයන්හි සැÍසරනු මැනවි. මට මෙන් ඔබට මොහොතකටවත් විද්‍යුත් පතිනියගෙන් විරහවක් නොවේවා!

## සමාලෝචනය, නිගමනය සහ යෝජනාව

මෙහිදී පළමු ව කෝශ ග්‍රන්ථානුසාරයෙන් මේඝය නිර්වචනය කොට තත් සංකල්පය පිළිබඳ හැඳින්වීමක් කරනු ලැබ ඇත. එහි ඇති මහදර්ථ සංස්කෘත සාහිත්‍ය මූලාශ්‍රයානුගත ව පැහැදිලි කොට ඇත්තේ එයිනික්ì;s j යි. අනතුරුව පාලි සහ සිංහල යන භාෂා ද්වයේ භාවිත මේඝ සංකල්පය ද සැකෙවින් සංකථිත ය. මෙහි දී එක ම මේඝය පාලියේ දී වැඩි වශයෙන් ආගමික දෘෂ්ටි කෝණයෙන් ද සංස්කෘතයේ දී වැඩි වශයෙන් සෞන්දර්යාත්මක දෘෂ්ටි කෝණයෙන් ද බලා ඇති බව පෙනී ගියේ ය. සිංහලයේ ද සෞන්දර්යාත්මක දෘෂ්ටි කෝණයෙන් මේඝය විවරණය කිරීම එහි බහුල භාවිතය විය.

මේඝ සංකල්පය යනු දේශ-කාල- සමය- භාෂා භේද ළඟ සිර කළ නොහෙන අකාලික සර්වත්‍ර සංකල්පයක් ය යන සහේතුක නිගමනයට එළැඹිය හැකි විය. වෛදික යුගයේ පටන් එය දෘශ්‍යමාන වීමත් සංස්කෘත, පාලි සහ සිංහල යන ත්‍රෛභාෂික සාහිත්‍යයේ එය දෘශ්‍යමාන වීමත් යුගයෙන් යුගය විවිධ රටවල ජීවත් වූ ජීවත් වන

106. මිසදූත 11. 55 page 182.

කවීනට ලේඛකයනට සිය නිර්මාණයන්හි ලා මේඝය වස්තු වීමත් එකී නිගමනයට හේතු විය. එසේ ම සංස්කෘත සාහිත්‍ය ග්‍රන්ථ අතුරින් මේඝ සංකල්පය ප්‍රමුඛ ව ඉදිරිපත් කොට ඇති සාහිත්‍ය කෘතිය වශයෙන් අපට කාලිදාසයන්ගේ මේඝදූතය හඳුනා ගත හැකි විය.

පාලි සිංහල සාහිත්‍ය ද්වයට සාමාන්‍යාවධානය ද සංස්කෘත භාෂා සාහිත්‍යයට විශේෂාධානය ද දී ලියැවුණු මේඝ සංකල්ප ප්‍රතිබද්ධ සංරචනයේ දී අපට පෙනී ගියේ යථෝක්ත භාෂා ත්‍රයට අදාළ ව තව දුරටත් තත් සංකල්පය විවරණය කිරීමේ අවකාශය පර්යේෂකයන් ඉදිරියේ ඇති බව ය. එසේ ම හින්දී, ඉංග්‍රීසි, ජර්මන් ආදි කොට ඇති භාෂා සාහිත්‍යයන් තුළ ද මේඝය අභාවිත වන්නට ඉඩක් නොමැත. එහෙයින් එකී පර්යේෂණ අවකාශ ද ඒ ඒ භාෂා විද්වතුන් ඉදිරියේ විවෘත ව ඇති බව පර්යේෂණ යෝජනාවක් වශයෙන් සඳහන් කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අතුකෝරළ; එල්. (2007). *අමාවකේ සඳක් සිඹිමි.* බොරලැස්ගමුව. සරසවි ප්‍රකාශකයෝ.

අබේසේකර, කේ, (2014). *හඬ ගුවන් විදුලි සඟරාව.* කොළඹ. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව.

අභයසුන්දර, වීඃ (1963). *සංගීත සංහිතා.* කොළඹ. ගොඩගේ හෝදරයෝ.

අරංගල, ආර්. සංස්. (1986). *මහගමසේකර; හංස ගීතය සහ තවත් නිර්මාණ.* කොළඹ. ගොඩගේ සහෝදරයෝ.

ආරියරත්න, එස්. (1975). *අරුන්දතී.* කොළඹ. ගොඩගේ සහෝදරයෝ.

ආරියරත්න, එස්. (1994). *තුටු පඬුරු.* කොළඹ. ගොඩගේ සහෝදරයෝ.

ආරියරත්න, එස්. (2000). *මකරන්ද.* කොළඹ. ගොඩගේ සහෝදරයෝ.

ආරියරත්න, එස්. (1978). *ළා හිරු දහසක්.* කොළඹ. ගොඩගේ සහෝදරයෝ.

කාන්තදේව, ආර්. ආර්., සංස්. (1886). *ශබ්දකල්පද්‍රුමඃ තෘතීය කාණ්ඩය.* කල්කටා. බෙංගාලි ආසියාතික සංගමය.

කුඩලිගම, ජී. සංස්. (2013). *එච්. ඇම්. කුඩලිගමඃ ඈ;* නව සංස්කරණය. කොළඹ. ෆාස්ට් පබ්ලිෂින් ප්‍රයිවට් ලිමිටඩ්.

කුඩලිගම, ජී. සංස්. (2013). *එච්. ඇම්. කුඩලිගම: කුණාටුව;* නව සංස්කරණය. කොළඹ. සාරංගා ප්‍රකාශකයෝ.

ඤාණරතන හිමි, පී. සහ ජයවර්ධන, කේ. බී. සංස්. (2017). *ශ්‍රීමද්දණ්ඩින්විරචිත දශකුමාරචරිත.* කොළඹ. සමයවර්ධන.

ඥානාලෝක හිමි, කේ. සහ වජිරඥාන හිමි, පී., සංස්. (2006). *අංගුත්තර නිකාය ද්විතීය භාගය; බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 18.* බණ්ඩාරගම. ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම.

ජයවර්ධන, එච්. වී. ජී. සංස්. (2004). *සිංහල නාමාවලිය.* කොළඹ. ගොඩගේ සහෝදරයෝ.

තෙන්නකෝන්, රැ. සංස්. (1955). *හංස සන්දේශය.* කොළඹ. එම්.ඩී. ගුණසේන සහ සමාගම.

දීක්ෂිත, එම්. ඩී. (1951). *ශ්‍රී ගීතගෝවින්දම්.* බරණැස.

ධම්මානන්ද හිමි, ටී. සංස්. (2006). *ඛුද්දකනිකාය; බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 36.* බණ්ඩාරගම. ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම.

ධර්මාරාම හිමි, ආර්. සංස්. (1963). *ශ්‍රී කුමාරදාසකෘත ජානකීහරණ මහාකාව්‍යය.* මහරගම. සමන් ප්‍රකාශකයෝ.

පඤ්ඤානන්ද හිමි, පී. සංස්. (2006). *ඛුද්දකනිකාය; බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 25.* බණ්ඩාරගම. ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම.

පඤ්ඤාසීහ හිමි, එම්ග සංස්. (2006). *ජාතක පාළි: ප්‍රථම භාගය; බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 36.* බණ්ඩාරගම. ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම.

පඤ්ඤාසීහ හිමි, එම්. සංස්. (2006). *ජාතක පාළි:* තෘතීය භාගය; බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 36ග බණ්ඩාරගමග ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම.

පලිහපිටිය, ආර්. ඒ. සංස්. (1984). *මහගම සේකර නොපළ ගීත.* කොළඹ. ගොඩගේ සහෝදරයෝ.

පැට්රික්, එන්. (1997). *ඍග්වේද ගීතාවලී;* කොළඹ. ගොඩගේ සහෝදරයෝ

පෙරේරා, පී. බී. (1963). *විමලරත්න කුමාරගම.* කැලණිය. විද්‍යාලංකාර මුද්‍රණාලය.

ප්‍රඥාසාර හිමි, ශ්‍රී. සංස්. (2018). *ශ්‍රී රාහුල හිමි විරචිත සැළලිහිණි සන්දේශය: ප්‍රඥාසාර සංස්කරණය.* කැලණිය. විද්‍යාලංකාර මුද්‍රණාලය

මහගමසේකර, :1976*ග *මහගමසේකරගේ ගීත.* කොළඹ. ගාඩගෙ' සහෝදරයෝ

රාමනාරායණදත්තශාස්ත්‍රී. සංස්. (1963). *ශ්‍රීමද්වාල්මීකීරාමායණම්;මූලමාත්‍රම්.* ගෝරඛ්පුර්.

ලංකානන්ද හිමි, එල්., සංස්. (2006). *සංයුත්ත නිකාය පඤ්චම භාගය; බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 17.* බණ්ඩාරගම. ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම.

විජයතුංග, එච්. සංස්. (2015). *ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය.* කොළඹ. ගුණසේන.

විජයරත්න, කේ. එම්. (2018). *වැස්ස ඉන්නෙත් උණ අරන්.* බොරලැස්ගමුව. කර්තෘ ප්‍රකාශනයකි.

විජේසිංහ, ආර්. එස්. (2002). *වංකගිරිය අරණේ.* කොළඹ. ගොඩගේ සහෝදරයෝ.

විජේසිංහ, ආර්. එස්. (2004). *සුදු නෙළුම.* කොළඹ. ගොඩගේ සහෝදරයෝ.

විජේසිංහ, ආර්. එස්. (2007). *ආලකමන්දා.* ගිංතොට. කිණිහිරි ප්‍රකාශකයෝ.

විජේසිංහ, ආර්. එස්. (2012). *නිකිණි වැස්ස.* කොළඹ. ප්‍රබුද්ධ ප්‍රකාශකයෝ.

විමලබුද්ධි හිමි, වී. සංස්. (2024). *මහාකවිකාලිදාසවිරචිතමේඝදූත විස්තරාර්ථ සහිත පදගත සන්නස.* නුගේගොඩ. මොඩන් පොත් සමාගම.

සුදේව හිමි, ඩී. විමලසාර හිමි, පී. සහ සිරිසුධම්ම හිමි, ඒ. සංස්. (2020). *සම්මානිත මහාචාර්ය පී.බී. මීගස්කුඹුර ලේඛනාවලී.* කොළඹ. විදර්ශන.

සුමනසාර හිමි, කේ., සංස්. (2005). *ථෙර-ථෙරීගාථා* පාළිඃ *ඛුද්දකනිකාය; බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 28.* බණ්ඩාරගම. ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම

සොන්තක්කේ, එන්. එස්. සංස්. (1936). *ඍග්වේදසංහිතා - ද්විතීය භාගඃ; ශ්‍රීමත් සායනාචාර්ය විරචිත භාෂ්‍යසමේතා.* පූනා. වෛදික සංශෝධන මණ්ඩලය.

සෝමානන්ද හිමි, ටී. සංස්. (1999). *ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම ශාස්ත්‍රීය සංග්‍රහය.* පන්නිපිටිය. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂොපකාර සමාගම.

සෝරත හිමි, වී. සංස්. (1970). *ශ්‍රී සුමංගල ශබ්දකෝෂය ( සිංහල-සිංහලාර්ථ) ද්විතීය භාගය.* කොළඹ. අභය ප්‍රකාශකයෝ.

Carter, C. (1965). *A Sinhalese – English Dictionary*. Colombo. Gunasena.

Disanayaka, J. B. Ed. (2017). *Encyclopadia of Sinhala Language and Culture.* Colombo. Sumitha.

Kale, M. R. Ed. (1934). *The Meghaduta of Kalidasa, with the Commentary (Sanjivani) of Mallinatha*. Bombey.

Kale, M.R. Ed. (1995). *Pancatantra of Vishnusharman*ග Delhi.

Macdonell, A.A. (1957). *A Vedic Reader for Students*. Madrass.

Paranavitana, S. (1956). *Sigiri Graffity*¦ London. Oxford University Press.

Upadhye, S.V. & Kale, M.R. Ed. (1997) *The Rthusamhara of Kalidasa with Sanskrit Text.* Delhi.